**බළන්ගොඩ නගර සභාව**

**2025.10.27 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව**

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2025.10.27**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ.ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රුමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී. අනතුරුව ගරු සභාපතිතුමා පැවසූයේ මෙම ගරු සභාව ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නගර සභා ආඥා පනත ප්‍රකාරව පවත්වා ගෙන යාම සඳහා සියළු දෙනාගේම වගකීමක් පවතින බවත් සභාපති ලෙස තමාට විශේෂ වගකීමක් පවතින බවත් එබැවින් සභාවේ න්‍යාය පත්‍රයට පරිබාහිර කිසිඳු කාරණාවක් සම්බන්ධව මෙහි සාකච්ඡා කිරීමට හැකියාවක් නොපවතින බවත් න්‍යාපත්‍රානුකූලව සභාවේ කටයුතු සිදු කර ගෙන යාම වෙනුවෙන් සියළු දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසත්ය. මෙහිදී අද‍දින සභාවේ න්‍යාය පත්‍රය වන්නේ 2025.10.14 දිනැතිව අඩාලව කල් තැබූ රැස්වීමේ න්‍යාය පත්‍රයේ ඉතිරි කොටස වන කල් දී ඇති යෝජනා අංක 07:01:03 සිට බවත් එතුමා පවසන ලදි.

**07:01:03** සභාව සතු ZA-0228 ගිනි නිවන රථය සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල 02 ක් ලබා ගැනීම, 2.5" දිග හෝස් කැබලි 06 ක් මිලදී ගැනීම, SPRAY NOZZLE ලබා ගැනීම, Suction Hose කැබලි 01 ක් ලබා ගැනීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සිතුමිණ එන්ටර්ප්‍රයිස් වෙත රු.881,500.00 ක් ගෙවීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.ඒන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසූයේ මෙම අළුත්වැඩියාව සභාවෙන් අනුමැතිය ලබාගෙන සිදු වූවක් නොවන බවත් තමන් එම ගෙවීම වෙනුවෙන් විරුද්ධ වන බවත් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය වන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මීට අදාළ ලිපිගොනුව සභාවට රැගෙන එන ලෙස පැවසූ බවත් ඒ අනුව එම ලිපිගොනුව සභාව වෙත ගෙන ඒම සුදුසු බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ මෙම ගිනි නිවන රථ අළුත්වැඩියාව සම්බන්ධ බිල්පතෙහි දුරකථන අංකයේ අංකයක් අඩුවීම සම්බන්ධව ගැටළුව ඇතිවූ බවට මාධ්‍යය තුළින්ද ප්‍රචාරය වූ බවත්, නමුත් එම ආයතනයෙන් ලබාදුන් මිල කැඳවීමේ දුරකථන අංකය නිවරදිව පවත්නා බවත් තමන් මෙම සිද්ධිය පදනම් කරගෙන පෞද්ගලිකව මෙම සිතුමිණ ඒන්ටර්ප්‍රයිසස් ආයතනයට කතා කල බවත් ඒ අනුව එම ආයතනයෙන් පැවසූයේ මෙම බිල්පත ගෙවීමේ හැකියාවක් නොමැතිනම් අදාළ භාණ්ඩ ආපසු එවන ලෙස දැනුම් දුන් බවත්ය. මෙම ගිනි නිවන රථ අළුත්වැඩියාව සිදු කිරීමට පෙර ඩිපෝ ඉංජිනේරු වාර්තාව ලබා ගෙන ඇති බවත්, අවසානයේ වැඩ අවසන් කර වැඩ අවසන් වාර්තාවද ලබා ගෙන ඇති

බවත්, හදිසි ගිනි ගැනීම් වලදී ගිනි නිවන රථය මනාව භාවිතා කළ හැකි පරිදි පැවතිය යුතු බවත්, එසේ නොවන්නේ නම් සභාවට මෙන්ම පවත්නා රජයටද එය කැළලක් බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසුයේ ගිනි නිවන රථයේ වර්තමාන අයිතිය පවතින්නේ කාහටද යන්න විමසීම් කිරීමත් සමඟම මෙම සියළු කාරනා පිළිබඳ වැඩ අධිකාරි මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත් කරකරන ලදි.

**පෙ.ව.10.16 ට පමණ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.**

අනතුරුව අදාළ කරුණු විමසීමෙන් පසු ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරකරන ලදි.

කණ්ඩායමක් ඉහත 07:01:03 යෝජනාවට විරුද්ධ වන බැවින් ගරු නාගරික මන්ත්‍රීතුමන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්දයක් පැවැත්වීම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඒම්.ඩබ්.විමලසිරි මැතිතුමා යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ඉහත 07:01:03 යෝජනාව වන සභාව සතු ZA-0228 ගිනි නිවන රථය සඳහා ආරක්ෂිත ඇඳුම් කට්ටල 02 ක් ලබා ගැනීම, 2.5" දිග හෝස් කැබලි 06 ක් මිලදී ගැනීම, SPRAY NOZZLE ලබා ගැනීම, Suction Hose කැබලි 01ක් ලබා ගැනීම හා අලුත්වැඩියා කිරීම වෙනුවෙන් සිතුමිණ එන්ටර්ප්‍රයිස් වෙත රු.881,500.00 ක් ගෙවීම යන යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 06 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා

02. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා

03. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා

04. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය

05. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය

06. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

එකී යෝජනාවට ඡන්දය ලබා දිමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් 02 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා

02.ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා ලෙස සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර ඒ අනුව 07:01:03 යෝජනාව වැඩි ඡන්ද 02කින් සභා සම්මත විය.

**07:01:04** 2025.09.16 දින මුදල් කාරක සභාවේ නිර්දේශ පරිදි වීථි පහන් 720 ක් මිලදී ගැනීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම සහ එකී මිලදී ගැනීම වෙනුවෙන් එන්.එම්.අයි ඉන්ද්‍රා (පුද්ගලික )සමාගම වෙත රු.1,484,998.85 ක් ගෙවීම.

| විස්තරය | ප්‍රමාණය | ඒකක මිල (රු.) | මිල (රු.) |
|---|---|---|---|
| GREEN BULB HIGHPOWER 30W | 720 | 1747.88 | 1,258,473.60 |
| VAT 18% | | | 226,525.25 |
| TOTAL | | | 1,484,998.85 |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:05** 2025 සැප්තැම්බර් මස දෛනික වැටුප් රු.1,584,742.66 ක මුදලක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳව තම අදහස් දක්වමින් 2025 සැප්තැම්බර් මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,584,742.66 දරා ඇති බවත් සභාවේ ස්ථිර සේවකයන් සිටියදී මෙසේ දෛනික වැටුපක් දරා ඇති බවත්, දෛනික වැටුප් සඳහා ගෙවන නුපුහුණු ශ්‍රමයට ගෙවන මුදල වන රු.1900.00 වැටුප යටතේ බැලූ විට මෙම මස තුළදී සේවකයන් 834 දෙනෙකුගේ සේවය ලබා ගෙන ඇති බවත් සම්බන්ධව පැහැදිලි කිරීමක් අවශ්‍ය බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමාගේ දැන්වීම් පරිදි කර්මාන්ත කමිටු සභාපති වන ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා මේ සම්බන්ධව පැහැදිලි කිරීමක් කරමින්, තමන් මේ පිළිබඳව සොයා බැලූ බවත් කර්මාන්ත සඳහා මෙම දෛනික වැටුප් මුදලින් රු.282,000 ක පමණ මුදලක් දරා ඇති බවත්, රියදුරන් 05 දෙනෙකුගේ වැටුප අන්තර්ගත බවත්, බැංකියවත්ත ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ අංගනයේ සේවකයන් වැටුපද අන්තර්ගත බවත් පවසන ලදී.

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා මෙම ගෙවන වැටුප පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීම කළ යුතු බවයි. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමාද ප්‍රකාශ කලේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැහැදිලි කළ ආකාරයට අංශ අනුව සාරාංශගතව විස්තරාත්මකව ලබා දෙන්නේ නම් සභාව පවත්වා ගෙන යාම පහසු වන බවයි.ඒ අනුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාද පවසා සිටියේ මින් පෙර සභාවාරවලදීද මෙලෙස විස්තරාත්මත්මකව තොරතුරු ලබා දෙන ලෙසට දැන්වීම් සිදු කළ බවයි.

සභාව තුළ වැඩ පහසුකර ගැනීම වෙනුවෙන් කාරක සභා ස්ථාපිත කර ඇති බැවින් එකී කාරක සභාව වලදී මෙවැනි කරුණු විස්තරාත්මකව සාකච්ඡා කළ හැකි බවද, ඒ අනුව මහ සභාවට එම කරුණු මෙලෙස සාරාංශගතව පැමිණීම සභාව වඩාත් පහසු කරන බවද, ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.ඒන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය පැවසුයේ තමන් එම අනු කමිටු වල සාමාජිකත්වය නොදරන බැවින් එම තොරතුරු අවශ්‍ය බවයි.ඒ අනුව ගරු සභාපතිතුමන් අදාළ සාරාංශගතකිරීම් සහිතව තොරතුරු ලබා දෙන ලෙස ලේකම්තුමිය සහ කාර්මික නිලධාරී මහතා වෙත උපදෙස් ලබා දෙන ලදි.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:06** 2025.09.15 දින සිට 2025.09.30 දින දක්වා බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීම වෙනුවෙන් කසළ ටෙන්ඩර්කරු වෙත රු.525,000.00 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:07** 2025.12.05 වන දින සහ 2025.12.11 යන දිනයන්හිදී ගලි බවුසර් සේවාව ලබා ගැනීම වෙනුවෙන් 20/339, සමඟි මාවත, අක්කර 18, බළන්ගොඩ ලිපිනයේ පදිංචි එච්.එන් රංජිත් බෝපිටිය යන අය විසින් ගෙවන ලද රු.17,000 මුදල අදාළ ස්ථානයට ළඟාවීමේ නොහැකියාව මත ආපසු ගෙවීම් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:08** 2025.08.04 වන දින ජේ.සී.බී යන්ත්‍රය ලබා ගැනීම වෙනුවෙන් 151/B,විද්‍යාල මාවත, කුමාරගම, බළන්ගොඩ යන ලිපිනයේ පදිංචි එච්.විජිත කුමාර යන අය විජිත කන්ස්ට්‍රක්ෂන් නමින් ගෙවන ලද රු.12,000.00 මුදල එම ආයතනයේ ඉල්ලීමක් හේතුවෙන් සේවාව ලබා නොදීම මත ආපසු ගෙවීම් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:09** සභාවේ සම්පත් පියසට සහ 3R ඒකක සඳහා අබලි ද්‍රව්‍ය (නොදිරන) ගැනුම් මිල සංශෝධනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | | රු.ශත |
|---|---|---|---|
| | බෝතල් | කි.01 | |
| බෝතල් අවුන්ස | 01 | | 3.00 |

| | | | |
|---|---|---|---|
| හතරැස් අරක්කු බෝතල් 01 (750ml) | 01 | | 12.00 |
| හතරැස් බෝතල් 1/2 | 01 | | 8.00 |
| බෝතල් ¼ (175ml) | 01 | | 3.00 |
| බෝතල්කටු | | ✓ | 10.00 |
| ප්ලාස්ටික් | | ✓ | 40.00 |
| සුදු පත්තර | | ✓ | 35.00 |
| කඩදාසි | | ✓ | 10.00 |
| පොත් | | ✓ | 35.00 |
| කාඩ්බෝඩ් | | ✓ | 20.00 |
| පොල් කටු | | ✓ | 40.00 |
| බියර් ටින් | | ✓ | 110.00 |
| යකඩ | | ✓ | 70.00 |
| තහඩු | | ✓ | 8.00 |
| ඇලුමිණියම් | | ✓ | 250.00 |
| පෙට් බෝතල් (බේල් නොකල) | | ✓ | 50.00 |
| චීනවට්ටි | | ✓ | 15.00 |
| බැටරි (වාහන) | | ✓ | 200.00 |
| මයිලෝ/නැවුම් එලකිරි(කඩදාසි) | | ✓ | 15.00 |
| මිශ්‍ර පොලිතින් (රීයම් දවටනය රහිත කවර) | | ✓ | 05.00 |
| බට | | ✓ | 8.00 |
| වයර් | | ✓ | 25.00 |
| PVC | | ✓ | 50.0 |

- බෝතල් කටු හැර අනෙක් විදුරු කටු හා ටෝච් බැටරි /පොලිතින් පුරවන ලද බෝතල් මිලදී නොගනී.
- හතරැස් බෝතල් හැර අනෙක් බෝතල්, බෝතල් කටු ලෙස මිලදි ගනු ලැබේ.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමන් පවැසුයේ ඉහත යෝජනාව පරිදි වෙළඳපළ මිල සලකා අබලි ද්‍රව්‍ය ගැනුම් මිල සංශෝධනයක් අනිවාර්යෙන් සිදු කළයුතු බවත් අබලි ද්‍රව්‍ය වෙළඳපොළ මිල හා සභාව මේ වන විට එම ද්‍රව්‍ය ලබා ගන්නා ගැණුම් මිල අතර විශාල වෙනසක් පවතින බැවින් සභාව වෙත නොදිරන ද්‍රව්‍ය ලබා දීම අඩු වී ඇති බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සහා සම්මත විය.**

**07:01:10** 2026 වර්ෂය සඳහා බළන්ගොඩ නගර සභාවේ පහත සඳහන් බදු හා ගාස්තු පැනවීම වෙනුවෙන් ගැසට් නිවේදන පළ කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

**<u>2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම.</u>**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 166 වන වගන්තිය යටතේ බළන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභා සීමාව ඇතුළත පිහිටියා වූ නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම්වල, ගෙපත්වල වාර්ෂික වටිනාකම සඳහා 2018 වර්ෂයේදී සිදුකරන ලද තක්සේරුව/ සතොයක්ෂණය 2026 වර්ෂය සඳහා පාදකකර ගැනීමටත්, එකී තක්සේරුව මත ඉහත කී නගර සභා ආඥා පනතේ 160 වන වගන්තිය ප්‍රකාරව බලන්ගොඩ නගර සභාව වෙත පැවරී ඇති බලතල යටතේ බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ කිසියම් දේපළක් මත ඉහත කී තක්සේරුව සඳහා නියමකර ඇති වාර්ෂික වටිනාකමින්,

(අ). නේවාසික ස්ථාන සඳහා සියයට හතරක (4%) වාර්ෂික වරිපනම් බදු අනුප්‍රමාණය,

(ආ). වෙළඳ හෝ වාණිජ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන දේපළ මත සියයට පහක (5%) වරිපනම් බදු අනුප්‍රමාණය,නියමවිය යුතු බවටත්,

තවද, 2026 වර්ෂයේ පහත උප ලේඛනයෙහි සඳහන් එක් එක් කාර්තුව වෙනුවෙන් ඊට ඉදිරියෙන් නිරූපිත දිනයට පෙර එසේ නියම කරන ලද වාර්ෂික වරිපනම් බද්ද නගර සභා අරමුදලට ගෙවිය යුතු බවටත්, එලෙස සමස්ථ වාර්ෂික වරිපනම් බද්ද 2026 වර්ෂයෙහි ජනවාරි මස 31 වන දින හෝ ඊට ප්‍රථම ගෙවන්නේ නම් වාර්ෂික වරිපනම් බද්දේ ප්‍රමාණයෙන් සියයට දහය(10%)ක වට්ටමක්ද, එකී උපලේඛනයෙහි එක් එක් කාර්තුව ඉදිරියේ තුන්වන තීරුවේ නිරූපිත දිනයට පෙර අදාළ වරිපනම් බදු මුදල නගර සභා අරමුදලට ගෙවනු ලබන්නේ නම් එක් කාර්තුවකට අදාළ මුදලින් සියයට පහ(5%)ක වට්ටමක්ද නගර සභාව විසින් ලබාදිය යුතු වේ.

**ඉහත කී උපලේඛනය**

| කාර්තුව | ගෙවිය යුතු දිනය | 5% වට්ටම සඳහා හිමිකම ලබන අවසාන දිනය |
|---|---|---|
| 2026 වර්ෂයේ පළමුවන කාර්තුව | 2026-03-31 | 2026-01-31 |
| 2026 වර්ෂයේ දෙවන කාර්තුව | 2026-06-30 | 2026-04-30 |
| 2026 වර්ෂයේ තුන්වන කාර්තුව | 2026-09-30 | 2026-07-31 |
| 2026 වර්ෂයේ හතරවන කාර්තුව | 2026-12-31 | 2026-10-31 |

**2026 වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.**

255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 162(1) වන වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත්, බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පනවා ක්‍රියාත්මක වන අතුරු ව්‍යවස්ථා යටතේ බලපත්‍රයකට යටත් වෙළඳ ව්‍යාපාර සම්බන්ධයෙන් 2026-03-31 දිනට පෙර බලපත්‍රයක් ලබාගත යුතු වේ.

1939 අංක 61 දරණ නගර සභා ආඥා පනත හෙවත් ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරයේ 162 වන වගන්තිය හා 164 වන වගන්තිය ප්‍රකාරව හා 2019-12-05 දිනැති අංක 2152/34 අති විශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කර ඇති බලංගොඩ නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන අන්තරාදායක,අප්‍රසන්න,අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් වාර්ෂික වටිනාකම් මත එහි 11 තීරයේ සඳහන් බලපත්‍ර ගාස්තු 2019-12-05 දිනැති අංක 2152/34 අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කාර්යයන් සඳහා අය කරනු ලැබේ.

තවද, එකී ස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති හෝටලයක්, ආපනශාලාවක්, නවාතැන්පලක් වන විටකදී ඊට අදාළ බලපත්‍ර ලබාදීමේදී එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ පෙර වර්ෂයේ ලැබීම් වලින් 1% (සියයට එක)ක් බලපත්‍ර ගාස්තු ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටත් එම නියමය 2026 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**උප ලේඛනය**

| I වන තීරය | 11 වන තීරය |
|---|---|
| වාර්ෂික වටිනාකම- | රු. ශත |
| රු,750 නොයික්මවන විට | 500.00 |
| රු,750 ඉක්මවන නමුත් රු,1500 නොයික්මවන විට | 750.00 |
| රු,1500 නොයික්මවන විට | 1,000.00 |

**ඉහත කී උප ලේඛනය**

| I වන තීරුව | | II වන තීරුව |
|---|---|---|
| අනු | කර්මාන්තයේ ස්වභාවය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම |

| අංකය | | රු. 750/= නොයික්මවන අවස්ථාවක | රු. 750/= ඉක්මවන නමුත් රු. 1,500/= නොයික්මවන අවස්ථාවක | රු. 1,500/= ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| 01 | නවාතැන්පලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 02 | භෝජනාගාරයක් පවත්වාගෙන යාම (පිසූ ආහාර සැපයීම හා අළෙවිය) | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 03 | හෝටලයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 04 | තේ, කෝපි/ සිසිල් බීම අළෙවිහලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 05 | බේකරියක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 06 | කරණවැමි මැදිරියක් (බාබර් සාප්පු) පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 07 | ගෝ ඝාතකාගාරයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 08 | මස්/ මාළු/ බිත්තර අළෙවිහලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 09 | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 10 | බිම්මල් ඇසුරුම් කිරීම හා අළෙවිය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 11 | යෝගට්,අයිස්ක්‍රීම්,නිෂ්පාදනය,ඇසුරුම් කිරීම හා අළෙවිය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 12 | රසකැවිලි,බයිට් නිෂ්පාදනය, ඇසුරුම් කිරීම හා අළෙවිය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 13 | සත්ව ගොවිපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 14 | සත්ව ආහාර ඇසුරුම් කිරීම හා අළෙවිය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 15 | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 16 | වැල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 17 | වඩු මඩුවක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 18 | සුරතල් සතුන් අළෙවි කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 19 | ගරාජයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 20 | මෝටර් රථ/ ත්‍රී රෝද රථ/ යතුරුපැදි සේවා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 21 | මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථාන රූපලාවන්‍යාගාර | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 22 | කිරි පට්ටි/ කිරි විකිණීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 23 | ස්ප්‍රේ පේන්ට් වැඩ කරන ස්ථානයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 24 | අවමංගල්‍ය සේවා පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 25 | දැව ඉරුම් පලත් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 26 | පොල්තෙල් නිෂ්පාදනය හා අළෙවි කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 27 | සිමෙන්ති විකිණීම හා ගබඩා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 28 | සිමෙන්ති ගඩොල්/කොන්ක්‍රීට් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 29 | ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 30 | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 31 | ටයර් ටියුබ් වෝල්කනයිස් කිරීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 32 | ලියවන පට්ටල පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 33 | පාවිච්චි කරන ලද ටයර් හෝ ටියුබ් ගබඩා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 34 | අලුත් ටයර් හෝ ටියුබ් ගබඩා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 35 | ගෘහ භාණ්ඩ/දැව භාණ්ඩ නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 36 | එළවළු හා පළතුරු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 37 | ආහාර විජලනය කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 38 | පිසූ ආහාර ද්‍රව්‍ය ජංගම (සංචාරක)වෙළඳාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 39 | ගෝ ඝාතක තාවකාලික බලපත්‍ර | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 40 | කුළු බඩු ,තේ පිටි,ආහාර ද්‍රව්‍ය පැකට් කර අලවිය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 41 | පච්ච /ටැටූ ගැසීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

**<u>2026 වර්ෂය සඳහා කර්මාන්ත බද්ද පැනවීම.</u>**

255 වැනි අධිකාරිය වන 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 අ(1)(2) වගන්තිවලින් බළන්ගොඩ නගර සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන්, එම උපලේඛනයේ 11 වැනි තීරුවේ, ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානයේ

වාර්ෂික වටිනාකමට අනුරූප තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කල යුතු බවටත්, එකී කර්මාන්ත බද්දට යටත් තැනැත්තෙකු 2026 වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනට පෙර බළන්ගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

උපලේඛනය

| I වන තීරුව | | II වන තීරුව | | |
|---|---|---|---|---|
| අනු අංකය | කර්මාන්තයේ ස්වභාවය | පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
| | | රු. 750/= නොයික්ම වන අවස්ථාවක | රු. 750/= ඉක්මවන එහෙත් රු. 1,500/= නොයික්මවන අවස්ථාවක | රු. 1,500/= ඉක්මවන අවස්ථාවක |
| 01 | කුෂන් වැඩපලක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 02 | ස්වර්ණාභරණ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 03 | මැටි භාණ්ඩ නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 04 | දුරකථන/ ඡායාපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 05 | මැණික් කැපීම හා ඔප දැමීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 06 | මිනී පෙට්ටි නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 07 | වඩු කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 08 | තේ කර්මාන්තශාලා | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 09 | ගමන් මළු නිපදවීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 10 | පාවහන් නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 11 | ගීත/ වීඩියෝ පටිගත කිරීම හෝ තැටිගත කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 12 | පින්තූර රාමු කිරීමේ වැඩපල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 13 | කොහු නිෂ්පාදනය | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 14 | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 15 | ඩිජිටල් ප්‍රින්ටින් | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 16 | ඡායා පිටපත් ගැනීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 17 | ඇඳුම් මැසීමේ ස්ථාන (ටේලර් ෂොප්) | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 18 | ජංගම දුරකථන අලුත්වැඩියා කිරීමේ ස්ථාන | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 19 | ඉලෙක්ට්‍රොනික් උපකරණ අලුත්වැඩියා කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 20 | නගර සහ උද්‍යාන අලංකරන සැළසුම් | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | සකස්කරනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 21 | යතුරු කැපීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 22 | කාර්මික උපකරණ අලුත්වැඩියාව | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 23 | ගෘහ විදුලි උපකරණ අලුත්වැඩියාව | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 24 | ඔරලෝසු අලුත්වැඩියාව හා විකිණීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 25 | වානේ කම්මල | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 26 | පිළිම,භාණ්ඩ සකස් කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 27 | රත්තරං ආලේප කිරීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |
| 28 | මාළු ටැංකි සැකසීම | රු. 500.00 | රු. 750.00 | රු. 1,000.00 |

**2026 වර්ෂය සඳහා ව්‍යාපාරික බද්ද පැනවීම**.

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරිය හෙවත් 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 165 (ආ) වගන්තියෙන් නගර සභාවලට පැවරී ඇති බලතල ප්‍රකාරව පහත 2 වන උප ලේඛනයේ සඳහන් ව්‍යාපාරයක් බලංගොඩ නගර සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේදී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම, එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් ,මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක එහි 11 වැනි තීරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා පනවා අය කිරීමටත්, බද්දට යටත් සෑම තැනැත්තෙකුම එකී ව්‍යාපාර බද්ද 2026 වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර බලංගොඩ නගර සභා කාර්යාලයට ගෙවිය යුතු වේ.

1- **උපලේඛනය**

| **I වන තීරුව** | **II වන තීරුව** | |
|---|---|---|
| බද්ද අදාළ වන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද | |
| | රුපියල් | ශත |
| රුපියල් 6,000.00 නොඉක්මවන අවස්ථාවක | - | - |
| රුපියල් 6,000.00 ඉක්මවන එහෙත් රුපියල් 12,000.00 නොයික්මවන අවස්ථාවක | 90 | 00 |
| රුපියල් 12,000.00 ඉක්මවන එහෙත් රුපියල් 18,750.00 නොයික්මවන අවස්ථාවක | 180 | 00 |
| රුපියල් 18,750.00 ඉක්මවන එහෙත් රුපියල් 75,000.00 නොයික්මවන අවස්ථාවක | 360 | 00 |
| රුපියල් 75,000.00 ඉක්මවන එහෙත් රුපියල් 150,000.00 නොයික්මවන අවස්ථාවක | 1,200 | 00 |
| රුපියල් 150,000.00 ඉක්මවන අවස්ථාවක | 3,000 | 00 |

**11- උප ලේඛනය**

ව්‍යාපාරික බද්දට යටත්වන විෂයයන්

01. ආයුර්වේද බෙහෙත් අළෙවිය
02. ඇස් කණ්ණාඩි අළෙවිකිරීම
03. ඉංග්‍රීසි බෙහෙත් අළෙවිය (ෆාමසි)
04. ඉන්ධන පිරවුම්හල
05. උකස්බඩු ගන්නා ස්ථාන
06. උත්සව භාන්ඩ කුලී පදනම මත සැපයීම
07. උත්සවශාලාවක් පවත්වාගෙන යාම
08. කුළු බඩු එකතුකිරීම හා අළෙවිය
09. කෘෂි උපකරණ අළෙවිය/කෘෂි රසායන හා පොහොර
10. කොමිස් නියෝජිතවරුන්/ වෙන්දේසිකරුවන්
11. ගෘහ නිර්මාණ සැලසුම් සකසන ස්ථානයක් පවත්වාගෙන යාම
12. ඛනිජ තෙල් හා ලිහිසුම් තෙල් අළෙවිය
13. ගෘහ භාණ්ඩ අළෙවිය
14. විදේශ රැකියා නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
15. ගොඩනැගිලි ද්‍රව්‍ය අළෙවිය
16. ග්‍රොසරියක් පවත්වාගෙන යාම/ සිල්ලර වෙළඳාම
17. ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම
18. තරාදි අළෙවිය
19. තොග වෙළඳාම
20. දන්ත ශළ්‍යාගාරයක් ,දත් බැඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
21. දැව/ ලී අළෙවිය
22. දුම්පරීක්ෂණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
23. දුරකථන අළෙවිය
24. දුරකථන සේවා (කොමිනිකේෂන්)
25. දේශීය වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම /ආයුර්වේද බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම
26. නිමි ඇඳුම් අළෙවිය
27. නොතාරිස්/ නීතිඥ කාර්යාලයක් පවත්වාගෙන යාම
28. අබලි ද්‍රව්‍ය /පරණබඩු අලෙවිය /එකතු කිරිම හා අළෙවිය .
29. පරිගණක අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
30. පරිගනක/ පරිගනක උපාංග අළෙවිය
31. පාවහන් අළෙවිය
32. පුද්ගලික නියෝජිත තැපැල් කාර්යාල
33. පූජා භාණ්ඩ අළෙවිය
34. පෞද්ගලික අධ්‍යාපන ආයතනයක් පවත්වාගෙන යාම
35. ප්ලාස්ටික් භාණ්ඩ අළෙවිය
36. බටහිර වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම (මෙඩිකල් සෙන්ටර්ස්)
37. රටබීම අළෙවිය
38. මල් සහ පැළ වර්ග අළෙවිය
39. මැටි භාණ්ඩ අළෙවිය (මල් පොච්චි,විසිතුරු බඩු)
40. මිශ්‍ර වෙළඳාම
41. මූල්‍ය ආයතන
42. මෝටර් වාහන අමතර කොටස් අළෙවිය

43. මෝටර් සයිකල් අළෙවිය (යතුරු පැදි)
44. යන්ත්‍රසූත්‍ර කුලී පදනම මත සැපයීම
45. රක්ෂණ නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
46. රථ වාහන අලෙවිය
47. රථ වාහන කුලී පදනම මත යෙදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම
48. රන් භාණ්ඩ ,ස්වර්ණාභරණ අළෙවිය
49. මැණික් අළෙවිය
50. රා තැබෑරුමක් පවත්වාගෙන යාම
51. රියදුරු පුහුණු පාසැලක් පවත්වාගෙන යාම
52. රෙදිපිළි වෙළඳාම
53. රේස් ඔට්ටුපොලක් පවත්වාගෙන යාම
54. ලිපිද්‍රව්‍ය පාසැල් උපකරණ අළෙවිය
55. ලේ/ මුත්‍ර පරීක්ෂාව /රසායනාගාර සේවාවන් පවත්වාගෙන යාම
56. ලොතරැයි අළෙවිය
57. විදුලි උපකරණ අළෙවිය
58. විසිතුරු භාණ්ඩ අළෙවිය (ලවර්ස්)
59. වීඩියෝ පටි/ තැටි කුලියට දීම හා අළෙවිය
60. ව්‍යායාම උපකරණ අළෙවිය
61. ශරීර සුවතා මධ්‍යස්ථාන
62. හෙද හා සාත්තු සේවා පුහුණු ආයතන
63. ළදරු නිෂ්පාදන අලෙවිය.
64. වාහන යෝග්‍යතා සහතික නිකුත් කිරීම
65. අන්තර්ජාල ගණුදෙණු
66. සත්ව සායන
67. සෙල්ලම් භාණ්ඩ අලවිය
68. විවිධ සේවා සමුපකාර සමිති.
69. තීරෝද රථ අළුත්වැඩියාව හා අමතර කොටස් අලෙවිය
70. ගෑස් අලෙවිය
71. තැගි භාණ්ඩ අලෙවිය
72. බෙදා හැරීමේ සේවා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම
73. දුම්වැටි අලෙවිය
74. ජෝතිෂ්‍ය කාර්යාල
75. ඉදිකිරීම් සමාගම්
76. මගී ප්‍රවාහන කටයුතු
77. ද්‍රව්‍ය ජංගම (සංචාරක)වෙළඳාම
78. බෑග් අලෙවිය
79. දුම්කොළ පැකට් කර අලෙවිය
80. විදේශ සංචාරක සේවා
81. බුලත් විට අලවිය,
82. ටයර් අලවිය
83. මෝටර් සයිකල් අමතර කොටස් අලවිය
84. ඉංජිනේරු සේවා
85. විසිතුරු ගල්
86. කලාත්මක භාණ්ඩ අලවිය

87. තේ පිටි පැකට් කර අලෙවිය
88. පොල් වෙළදාම
89. පිහි,උදලු,වැනි උපකරණ අලවිය
90. පිරිසිඳු කරන ද්‍රව්‍ය අලවිය
91. හරිතාගාර ආර්ථික භෝග වගාව
92. ගබඩා

**2026 වර්ෂය සඳහා බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තු පැනවීම.**

බල්ලන් ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව බලංගොඩ නගර සභා සීමාව ඇතුළත ඇතිකරනු ලබන සෑම බල්ලෙක් හා බැල්ලියක් වෙනුවෙන් 2026 වර්ෂයේදී මෙම සභාවට ගෙවිය යුතු වාර්ෂික බල්ලන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව හා කරපටි ගාස්තුව ලෙස රුපියල් දෙසියය (රු.200.00)ක් විය යුතු බවට පනවා එම පැනවීම 2026 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**2026 වර්ෂය සඳහා කසළ ගාස්තු පැනවීම.**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය වූ නගර සභා ආඥා පනතේ 170 (අ) 1,2 වගන්ති හා එහි 157(9)(ආ) ප්‍රකාරවත් 1952 අංක 06 දරණ පළාත් පාලන මණ්ඩල ආදර්ශ උපනීති XXI අනුවත්, 2013-06-28 දිනැති නගර සභා බල ප්‍රදේශ තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා අනුව කසල ගාස්තු අය කල යුතු ආයතන හා ගාස්තු පහත පරිදි වේ.

| ස්වභාවය | වාර්ෂික ගාස්තු රු |
|---|---:|
| නවාතැන්පල | 6,000.00 |
| හෝටල් | 6,000.00 |
| බේකරි | 6,500.00 |
| රෙදිකඩ | 6,500.00 |
| බත් කඩ,කෝපි කඩ,ආපන ශාලා,තේ කඩ | 3,600.00 |
| භෝජනාගාර | 6,000.00 |
| සුපිරි වෙළඳසැල් | 15,600.00 |
| සිල්ලර කඩ | 2,500.00 |
| සැලූන්,රූපලාවන්‍යාගාර | 3,500.00 |
| වී මෝල් | 4,000.00 |
| පුද්ගලික පන්ති | 10,000.00 |

| | |
|---|---|
| තොග වෙළඳසැල් | 10,000.00 |
| හාඩ්වෙයාර් | 10,000.00 |
| සුරාසැල් | 10,000.00 |

**<u>2026 වර්ෂය සඳහා ගෝ ඝාතක ආඥා පනත ප්‍රකාරව කොටු ගාස්තු සහ බලපත්‍ර ගාස්තු පැනවීම.</u>**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 162(1) අ වන වගන්තිය ප්‍රකාරව සභාව වෙත පැවරී ඇති බලතල අනුව 1893 අංක 09 දරණ ගෝ ඝාතක ආඥා පනතේ 09 වන වගන්තිය ප්‍රකාරවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 10939 හා 1956-06-08 ගැසට් නිවේදනයේ අංක xv අනුව මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි තාවකාලික ගෝ ඝාතක බලපත්‍ර ගාස්තු නියම කර 2026 වර්ෂයේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු වේ.

**උපලේඛනය**

- තාවකාලික සෝ ඝාතක බලපත්‍ර ගාස්තුව රු. 2,500.00

පරීක්ෂා කිරීමේ ගාස්තු

- ගවයෙක් ඝාතනය කිරීමේ පරීක්ෂා කිරීමේ ගාස්තු රු. 300.00
- එළුවෙක් ඝාතනය කිරීමේ පරීක්ෂා කිරීමේ ගාස්තු රු, 150.00

**<u>2026 වර්ෂය සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු අය කිරිම නිවේදනය කිරිම.</u>**

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 26 වෙනි වගන්තිය යටතේ වූ නියමය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.01.27 අති විශේෂ ගැසට් පත්‍ර අංක 2264/18 පරිදි පාරිසරික ආරක්ෂණ බලපත්‍ර සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තු පහත සඳහන් පරිදි විය යුතු වේ.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු -රු4,000/=+ රජයේ අනුමත බදු

.01නව පාරිසරික ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.

මූලික ආයෝජනය මත පාදක වූ සංශෝධිත පරීක්ෂණ ගාස්තු

| මූලික මුළු ආයෝජනය(රු.) | ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුව (පවතින වටිනාකම) |
|---|---|
| 250,000/= ට අඩු | රු,3,000/= +රජයේ අනුමත බදු |
| 250,001/= සිට 500,000/= දක්වා | රු,3,750/=+රජයේ අනුමත බදු |
| 500,001/= සිට 1,000,000/= දක්වා | රු,5,000/=+රජයේ අනුමත බදු |
| 1,000,001/= ට වැඩි | රු,10,000/=+රජයේ අනුමත බදු |

.02පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීම.

පාරිසරික ආරක්ෂණ බලපත්‍ර අලුත් කිරීමේදී රු,3,000/=ක් වූ අවම පොදු ක්ෂේත්‍ර පරීක්ෂණ ගාස්තුවක් අය කිරීම සිදු කළ යුතු වේ.

**<u>2026 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවෙන් සපයනු ලබන සේවාවන් සඳහා ගාස්තු පැනවීම.</u>**

**උප ලේඛනය**

| අනු අං | සේවාව | කාරණය | 2026 වර්ෂයට ගාස්තුව |
|---|---|---|---|
| 01 | ජල සහතිකයක් ලබා ගැනීම | • අයදුම්පත් ගාස්තුව | රු, 300.00 |
| | | • සහතික ගාස්තුව | රු, 600.00 |
| | | • ලිපියක් ලබා දීමට | රු,1.000.00 |
| 02 | විදුලි සහතිකයක් ලබා ගැනීම | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 300.00 |
| | | • සහතික ගාස්තුව | රු. 600.00 |
| | | • ලිපියක් ලබා දීමට | රු,1.000.00 |
| 03 | ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම | • අයදුම්පත් ගාස්තුව | රු. 500.00 |
| 04 | බිම් කට්ටි සැළසුම් අනුමත කිරීම | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 500.00 |
| 05 | NBRO | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 100.00 |
| 06 | නොපවරා ගැනීමේ | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 300.00 |

| | | | |
|---|---|---|---|
| | සහතිකයක් ලබා ගැනීම | | |
| | | • සහතික ගාස්තුව | රු, 1,500.00 |
| 07 | ගොඩනැගිලි සීමා සහතිකයක් ලබා ගැනීම | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 300.00 |
| | | • සහතික ගාස්තුව | රු, 1.500.00 |
| 08 | ජල බවුසරය කුලියට සැපයීම | • පානීය ජල බවුසරයක්-ලීටර 3000 | රු, 6,000.00 |
| | | • පානීය ජලය ලබා ගැනීම වෙනුවෙන් ජල සම්පාදන මණ්ඩලයට ගෙවීම | .................. |
| | | • පානීය නොවන ජල බවුසරයක්-ලීටර 2500 | රු, 5,000.00 |
| | | • පානීය නොවන ජල බවුසරය ස්ථානයේ නතරකර තැබීම දිනකට | රු, 4,000.00 |
| | | මාර්ග සංවර්ධන කටයුතුවලදී ජලය ඉසීම හෝ පාර සේදීම වෙනුවෙන් එක ජල බවුසරයක් සඳහා අමතරව අය කෙරේ. | රු, 3,000.00 |
| | | (නගර සීමාවෙන් පිටතට ධාවනය වන සෑම කි.මී 1ක් සඳහාම රු,350/= ක් අය කෙරේ. | |
| 09 | ක්‍රීඩා පිටිය කුලියට දීම | • ක්‍රීඩා පිටිය පිරිසිදු කිරීමේ කාර්යය සඳහා ඇප තැන්පතුව | රු. 5,000.00 |
| | | • ක්‍රීඩා පිටිය දිනකට-පාසල් හැර | රු. 10,000.00 |
| | | • ක්‍රීඩා පිටිය දිනකට-පාසල් සඳහා | රු, 5,000.00 |
| | | • විදුලි ආලෝකය සමඟ එක් රාත්‍රියක් ක්‍රීඩා පිටිය නිදහස් කිරීම සඳහා | රු, 12,500.00 |

| | | | |
|---|---|---|---|
| | | • ආදායම් උත්පාදනය නොකර රාත්‍රිය ගතකරන අවස්ථාවලදී සවස 6 සිට වැඩිවන පැයකට | රු. 1000.00 |
| | ක්‍රීඩා පිටිය නොවන ඉතිරි බිම් තීරුව (ළමා උද්‍යානය හා පොළ අවට) | • සැණකෙළි හා සංගීත සංදර්ශන නොවන වැඩසටහන් සඳහා | රු. 7,500.00 |
| | | • සැණකෙළි හා සංගීත සංදර්ශන ඇප තැන්පතුව | රු 25,000.00 |
| | | • වැඩසටහනට අය කිරීම | රු 25,000.00 |
| 10 | ජේ.සී.බී. යන්ත්‍රය කුලියට දීම | යන්ත්‍ර පැයක් සඳහා(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු, 5,500.00 |
| 11 | ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 01)<br>ලෙලෙන තලනය කුලියට දීම(ටොන් 10) | • පැය අටක සේවා දින භාගයක් සඳහා (දින ½) (ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු, 4,000.00 |
| | | • පැය අටක සේවා දිනක් සඳහා (ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු, 7,000.00 |
| | | • යන්ත්‍ර පැය එකක් සඳහා (ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු, 5,900.00 |
| 12 | මෝටර් ග්‍රේඩරය කුලියට දීම | යන්ත්‍ර පැය එකක් සඳහා(ක්‍රියාකරු හා ඉන්ධන සමඟ) | රු, 6,500.00 |
| 13 | ගලි සේවාව සැපයීම ලීටර් 2500 ගලි බවුසරය සඳහා | • නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පූජ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු, 8,500.00 |
| | | • නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු, 10,000.00 |
| | | • නගර සීමාවෙන් පිටත නිවාස/ආගමික ස්ථාන/ පූජ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු, 11,000.00 |
| | | • නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු, 13,000.00 |
| | | • නගර සීමාවෙන් පිටතට වැඩිවන සෑම කිලෝමීටර් 1 ත් 10 ත් අතර (යාම සහ ආපසු පැමිණීම සඳහා) | රු, 350.00 |

| | | | |
|---|---|---|---|
| | | • කිලෝමීටර් 10 ත් 20 ත් අතර (යාම සහ ආපසු පැමිණීම සඳහා) | රු, 450.00 |
| | | • කිලෝමීටර් 20 ට වැඩි නම් (යාම සහ ආපසු පැමිණීම සඳහා) | රු, 550.00 |
| | ගලි සේවාව සැපයීම ලීටර් 4000 ගලි බවුසරය සඳහා | • නගර සීමාවේ නිවාස/ ආගමික ස්ථාන/ පූජ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු, 12,500.00 |
| | | • නගර සීමාවේ ව්‍යාපාරික ස්ථාන සඳහා | රු. 16,500.00 |
| | | • නගර සීමාවෙන් පිටත නිවාස/ආගමික ස්ථාන/ පූජ්‍ය ස්ථාන/ පාසැල් හා රජයේ ස්ථාන | රු. 16,500.00 |
| | | • නගර සීමාවෙන් පිටත ව්‍යාපාරික ස්ථාන සඳහා | රු. 16,500.00 |
| | | • නගර සීමාවෙන් පිටතට වැඩිවන සෑම කිලෝමීටර් 1 ත් 10 ත් අතර (යාම සහ ආපසු පැමිණීම සඳහා) | රු, 450.00 |
| | | • කිලෝමීටර් 10 ත් 20 ත් අතර<br>• (යාම සහ ආපසු පැමිණීම සඳහා) | රු, 600.00 |
| | | • කිලෝමීටර් 20 ට වැඩි නම් (යාම සහ ආපසු පැමිණීම සඳහා) | රු, 750.00 |
| 14 | සුසාන භූමි ගාස්තු | • ස්මාරක කුටියක් ඉදිකිරීමේ ගාස්තු | රු,1,00000.00 |
| 15 | වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 300.00 |
| 16 | තක්සේරු ලේඛනයට නම ඇතුළත් කිරීම | • ලියාපදිංචි ගාස්තුව | රු, 1,700.00 |
| 17 | තක්සේරු ලේඛනයේ පිටපතක් ලබා ගැනීම | • පිටපතක් සඳහා ගාස්තු | රු, 500.00 |
| 18 | වර්පනම් උද්‍යත ලබා ගැනීම | • එක් වර්ෂයක් සඳහා ගාස්තුව | රු, 500.00 |
| | ප්‍රචාරක දැන්වීම්,බැනර්, | • වර්ග අඩි 01ක් දින 14ක් ප්‍රදර්ශනය | රු, 100.00 |

| | | | |
|---|---|---|---|
| 19 | පෝස්ටර්, කටවුට් ප්‍රදර්ශනය කිරීම | කිරීම | |
| | | • වර්ග අඩි 01ක් මාසයක් ප්‍රදර්ශනය කිරීම | රු, 300.00 |
| 20 | දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම-ස්ථිර | • වර්ග අඩි 01 ක් වර්ෂයක් සඳහා ප්‍රදර්ශනය කිරීම | රු, 300.00 |
| | | • වර්ග අඩි 01ක් සහා දේපල තුළ වර්ෂයක් ප්‍රදර්ශනය සඳහා බිම් කුලිය | රු, 500.00 |
| 21 | එල්.ඊ.ඩී ප්‍රචාරක දැන්වීම් | • වර්ග අඩි 200ට අඩු එල්.ඊ.ඩී ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩි 01 ක් වර්ෂයක් ප්‍රදර්ශනය කිරීම සඳහා | රු, 700.00 |
| | | • වර්ග අඩි 200ට වැඩි එල්.ඊ.ඩී ප්‍රචාරක දැන්වීම් සඳහා වර්ග අඩි 01 ක් වර්ෂයක් ප්‍රදර්ශනය කිරීම සඳහා | රු, 750.00 |
| 22 | පුස්තකාල ගාස්තු අය කිරීම. | • සාමාජික අයඳුම් පත්‍ර ගාස්තුව | රු, 50.00 |
| | | • නගර සීමාව තුළ ළමා සාමාජික ගාස්තු | රු, 200.00 |
| | | • නගර සීමාව තුළ වැඩිහිටි සාමාජික ගාස්තු | රු, 300.00 |
| | | • නගර සීමාව තුළ ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු, 100.00 |
| | | • නගර සීමාව තුළ වැඩිහිටි සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තු | රු, 100.00 |
| | | • නගර සීමාවෙන් පිට වැඩිහිටි සාමාජික ගාස්තු | රු, 500.00 |
| | | • නගර සීමාවෙන් පිට ළමා සාමාජික ගාස්තු | රු, 200.00 |
| | | • නගර සීමාවන් පිට ළමා සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව | රු, 200.00 |
| | | • නගර සීමාවන් පිට වැඩිහිටි | රු, 200.00 |

| | | | |
|---|---|---|---|
| | | සාමාජිකත්වය අලුත් කිරීමේ ගාස්තුව | |
| | | • පාඨක සමාජයටඇතුළත් වීමේ ගාස්තුව | රු, 10.00 |
| | | • පාඨක සමාජයේ සාමාජික ගාස්තු වසර දෙකක් සඳහා | රු, 240.00 |
| | | • එක් දිනකට එක් පොතක් සඳහා පොත් ප්‍රමාද ගාස්තුව | රු, 2.00 |
| | | • නැතිවූ පොතක් සඳහා පොතේ නියම වටිනාකම සහ දෙපාර්තමේන්තු ගාස්තු ලෙස පොතේ වටිනාකමින් | 25% |
| | | • පොත් බැඳීමේ ගාස්තු | රු, 500.00 |
| 23 | පා පැදි බලපත්‍රය | • අයදුම්පත්‍ර ගාස්තුව | රු, 100.00 |
| | | • බලපත්‍රය | රු, 5.00 |
| 24 | අනුමත මිනින්දෝරු සැළැස්ම | • සහතික පිටපතක් නිකුත් කිරීම | රු, 500.00 |
| | | • ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට | රු , 800.00 |
| | | • ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට | රු. 600.00 |
| | | • ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු, 400.00 |
| 25 | අනුමත ගොඩනැගිලි සැළැස්ම | • සහතික පිටපතක් නිකුත් කිරීම | රු, 1,000.00 |
| | | • ලේඛන සෙවීමේ ගාස්තු-නම පමණක් ලබා දී ඇති විට | රු, 800.00 |
| | | • ලේඛන සෙවීමේ ගාස්තු-නම හා වර්ෂය ලබා දී ඇති විට | රු, 600.00 |
| | | • ලේඛන සෙවීමේ ගාස්තු-නම හා අංකය ලබා දී ඇති විට | රු, 400.00 |
| 26 | පෙර පාසැල | • ළමුන් ඇතුළත් කිරීමේ ගාස්තුව - බළන්ගොඩ නගර සභා පෙර පාසල (තැන්පතු -3750 පෙර පාසලට-3750) | රු, 7,500.00 |
| | | • වැවවත්ත පෙර පාසල සඳහා | රු, 1,000.00 |
| | | • බෝම්බුව පෙර පාසල සඳහා | රු, 4,000.00 |
| 27 | අළෙවි ප්‍රවර්ධන | • එක දිනක් සඳහා බිම් බද්ද | රු, 8,000.00 |

| | | | |
|---|---|---|---|
| | වැඩසටහන් | • වැඩිවන අමතර දිනයක් සඳහා | රු, 2,000.00 |
| 28 | කාබනික පොහොර අළෙවිය | • කිලෝ 50 පොහොර උරයක් | රු, 250.00 |
| | | • කිලෝ 50 පොහොර උරයක් ජංගම රථයෙන් මිලදී ගැනීම | රු, 500.00 |
| | | • කිලෝ 25 පොහොර උරයක් | රු, 125.00 |
| | | • කිලෝ 25 පොහොර උරයක් ජංගම රථයෙන් මිලදී ගැනීම | රු, 250.00 |
| | | • කිලෝ 10 පොහොර උරයක් | රු, 50.00 |
| | | • ජංගම රථයෙන් මිලදී ගැනීම. | රු, 100.00 |
| | | (කාබනික පොහොර කිලෝ 01 ක මිල රු,05.00 බැගින් කවර රහිතව ලබා දෙයි.මුද්‍රිත කවරයේ ලබා ගන්නේ නම් කවරයේ වටිනාකම අය කරනු ලැබේ.පාවිච්චි කරන ලද කවරයක පොහොර ලබා ගන්නේ නම් එම කවරයේ වටිනාකම අය කරනු ලැබේ) | |
| 29 | මාර්ග පළුදු කිරීම | • කාපට් ඇතිරූ මාර්ග තලය පළුදු කිරීම | අවසර නැත |
| | | • තාර/ කොන්ක්‍රීට්/ අන්තර් සම්බන්ධිත ගල් අතුරන ලද මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් නැවත සැකසීම සඳහා ගාස්තුව | රු, 4,000.00 |
| | | • පස් සහිත මාර්ග උරහිස සහ මාර්ග තලය පළුදු කිරීම වර්ග මීටර් 01ක් නැවත සැකසීම සඳහා ගාස්තුව | රු, 1,500.00 |
| 30 | පොදු වැසිකිළි යාමේ ගාස්තු | • වැසිකිළි/ කැසිකිළි යාම සඳහා එක් වරකට | රු, 30.00 |
| 31 | හිස් තාර බැරල් | • එක තහඩුවක් සඳහා | රු, 400.00 |

| | | | |
|---|---|---|---|
| 32 | ලේඛනාගාරයෙන් ලිපි/ලේඛන ස්කෑන් කර ලබා ගැනීම. | • A-4 කොලයක් සඳහා<br>(A-4 කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,8.00 ක් වේ) | රු, 50.00 |
| | | • ලීගල් කොලයක් සඳහා<br>(ලීගල් කොල 25කට වඩා ස්කෑන් පිටපත් අවශ්‍ය වන්නේ නම් 1ක් රු,9.00වේ.) | රු, 60.00 |
| | | • A-3 කොලයක් සඳහා | රු, 150.00 |
| | | • A-3 කොලවලට වඩා ප්‍රමාණයෙන් විශාල කොළ වර්ග අඩියක් සඳහා | රු, 90.00 |
| 33 | බලංගොඩ නව බස්නැවතුම්පොළ හා පොදුවෙළඳසැල කඩ කාමර සඳහා | • ජල සම්බන්ධතා ලබා ගැනීමේ ගාස්තුව | රු, 15,000.00 |
| | | • ජල සම්බන්ධතා මාසික ගාස්තුව | මාසික ජල බිල් පත අනුව |
| | | • විසන්ධි කළ ජල සම්බන්ධතාවය නැවත ලබා ගැනීම | රු, 2,500.00 |
| 34 | අස්ථානගත වූ බිල්පතක පිටපතක් ලබාගැනීමට | • පිටපතක් ලබාගැනීමේ ගාස්තු | රු, 100.00 |

ඉහත සඳහන් සියලු ගාස්තුවලට අමතරව රජයේ අනුමත බදු වෙනමම එකතු කරනු ලැබේ.

**<u>2026 වර්ෂය සඳහා බලංගොඩ නගර සභාවේ පැවැත්වෙන සතිපොළ සඳහා ගාස්තු පැනවීම.</u>**

01 පොළෙහි වෙළඳාම් කිරීම සඳහා භාණ්ඩ/ද්‍රව්‍ය රැගෙන සතිපොල භූමියට පැමිණෙන රථ වාහන වලින් කුලී/ගාස්තු අය කිරීම. (ඉරිදා දින පෙ.ව. 07.30 ට පෙර තොග පොල පැවැත්වෙන කාලයේදී පමනයි)

- ත්‍රීරෝද රථයක් සඳහා 120.00
- වෑන් රථ,මිනිට්‍රක් රථ,ඩිමෝ බට්ටා 250.00
- එල්ෆ් ලොරි රථ,තට්ටු ලොරි රථ,සිංගල් වීල් මෝටර් 350.00
- ලොකු ලොරි රථ,ඩබල් වීල් ලොරි රථ හා ඒ සමාන මෝටර් වාහන 600.00

02 තොග වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳුන් අතර සිදුවන තොග වෙළඳාමෙන් කුලී/ගාස්තු අය කිරීම.(සෑම සතියකම සෙනසුරාදා පස්වරු 06.00 සිට ඉරිදා දින පෙ.ව. 07.30 දක්වා)

රැගෙන එනු ලබන භාණ්ඩ/ද්‍රව්‍ය වල බර (කිලෝ ග්‍රෑම් ප්‍රමාණය ) එක් කිලෝවකින් රුපියල් එක බැගින් හුවමාරුවන කිලෝ ප්‍රමානය අනුව ගණනය කරන ලද ගාස්තුව.

03 පොළ මඩුවල සහ පොළ පරිශ්‍රයේ ඇතුලත අනෙකුත් ස්ථානවල වෙළෙන්දන් විසින් සිදුකරනු ලබන සිලලර වෙළඳාමෙන් කුලී/ගාස්තු අය කිරීම.
සතිපොළෙහි සිල්ලර වෙළඳාමේ නියුක්ත එක් වෙළෙන්දෙකුගෙන් එක් දිනකට ,එක් ස්ථානයක් වෙනුවෙන් පොළ කුලිය රු 350.00 (ඉරිදා දින පෙ.ව.06.00 සිට ප.ව.09.00 දක්වා)

**මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් ප්‍රදර්ශනය සම්පූර්ණයෙන්ම තහනම් දින නිවේදනය කිරීම.**

**- 2026 වර්ෂය -**

පහත උප ලේඛනයේ විස්තර කරනු ලබන දිනයන්හි සහ ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් පනවනු ලබන දිනයන්හි බළන්ගොඩ නගර සභාව විසින් අවස්ථාවෝචිත පරිදි තීරණය කරනු ලබන දිනයන්හි , බළන්ගොඩ නගර සීමාවේ 2026 වර්ෂයේ මස් පිණිස සතුන් මැරීම හෝ මරන ලද සතුන්ගේ මස් විකිණීම හෝ විකිණීම සඳහා මස් ප්‍රදර්ශනනය කිරීම නොකල යුතු වේ.

**උපලේඛනය**

| අනු අං | මාසය හා දිනය | දවස | කාරණය |
|---|---|---|---|
| 01 | 3 ජනවාරි | සෙනසුරාදා | දුරුතු පුර පසළොස්වක පෝය දිනය |
| 02 | 1 පෙබරවාරි | ඉරිදා | නවම් පුර පසළොස්වක පෝය දිනය |
| 03 | 4 පෙබරවාරි | බදාදා | නිදහස් දිනය |
| 04 | 2 මාර්තු | සඳුදා | මැදින් පුර පසළොස්වක පෝය දිනය |
| 05 | 1 අප්‍රේල් | බදාදා | බක් පුර පසළොස්වක පෝය දිනය |
| 06 | 1 මැයි | සිකුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනය |
| 07 | 2 මැයි | සෙනසුරාදා | වෙසක් පුර පසළොස්වක පෝය දිනට පසු දිනය |
| 08 | 30 මැයි | සෙනසුරාදා | අමතර පොසොන් පුර පසළොස්වක පෝය දින |
| 09 | 29 ජූනි | සඳුදා | පොසොන් පුර පසළොස්වක පෝය දිනය |
| 10 | 29 ජුලි | බදාදා | ඇසල පුර පසළොස්වක පෝය දිනය |
| 11 | 27 අගෝස්තු | බ්‍රහස්පතින්දා | නිකිනි පුර පසළොස්වක පෝය දිනය |
| 12 | 26 සැප්තැම්බර් | සෙනසුරාදා | බිනර පුර පසළොස්වක පෝය දිනය |
| 13 | 25 ඔක්තෝම්බර් | ඉරිදා | වප් පුර පසළොස්වක පෝය දිනය |
| 14 | 24 නොවැම්බර් | අඟහරුවාදා | ඉල් පුර පසළොස්වක පෝය දිනය |
| 15 | 23 දෙසැම්බර් | බදාදා | උඳුවප් පුර පසළොස්වක පෝය දිනය |

**<u>රථවාහන නැවතුම් සීමාව , රථ වාහන නැවතුම් ගාස්තු සහ රථ වාහන ඇතුළු කිරීමේ ගාස්තු නිවේදනය කිරීම.</u>**

**-2026 වර්ෂය-**

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 255 වන අධිකාරය හෙවත් 1939 අංක 61 දරණ නගර සභා ආඥා පනතේ 157(14)(අ) වගන්ති ප්‍රකාරවත් ඊට අදාළ අතුරු ව්‍යවස්ථාවන් යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවත් බළන්ගොඩ නගර සභා බලසීමාවේ රථ වාහන නැවතුම් සීමාව ,රථ වාහන නැවතුම් ගාස්තු සහ රථවාහන ඇතුළු කිරීමේ ගාස්තු අය කරනු ලබන සීමාව පහත I වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දක්වන ලද ආකාරයටත්, එම සීමාව ඇතුළත නතර කරනු ලබන එක් එක් රථ වාහනයකින් එක් දිනයකට අයකළ හැකි උපරිම ගාස්තු මුදල පහත II වන උප ලේඛනයේ සවිස්තරාත්මකව දැක්වෙන ආකාරයට විය යුතු වේ.

**ඉහත කී I වන උපලේඛනය**

බළන්ගොඩ නගර සභා බල සීමාවේ වෙළඳපල සීමාව ලෙස නම්කර ඇති සීමාවේ කොටසක් වන බළන්ගොඩ බදුල්ල මාර්ගයේ කිරිදිගල පල්ලිය (වැලිහරනාව හන්දිය) දක්වා ද, බළන්ගොඩ රාස්සගල පාරේ කොන්වන්ට් විදුහල දක්වා ද, බළන්ගොඩ රත්නපුර මාර්ගයේ HLW ඉන්ධන පිරවුම්හල දක්වාද, බළන්ගොඩ කල්තොට පාරේ ධර්මරත්න බස්නායක මහතාගේ නිවස දක්වාද, දොරවෙල නව අතුරු මාර්ගය( මොහාන් සාලිය එල්ලාවල මාවත) ද, ඇතුළත් වන පරිදි බළන්ගොඩ නගරයේ කෙළින් වීදිය, තානායම් පිවිසුම් පාර, බාන්ස් රත්වත්ත මාවත, බස් නැවතුම්පල පාර, පල්ලිය පාර ,ක්‍රීඩා පිටිය පාර හා ඒ ඇතුළත ඇති සියලුම වීථීන් හා වීථීන් දෙපස ගොඩනැගිලි සීමාව ඇතුළත වන සීමාව වේ.

**ඉහත කී II වන උපලේඛනය**

- ලොරියක්, බස්රථයක් හෝ වෙන යම් වාහනයක් සඳහා - රු. 100.00
- වෑන් රථයක්, ජීප් රථයක් සඳහා රු. 50.00
- මෝටර් කාර් රථයක් හෝ මෝටර් රථයක් - රු. 50.00
- ත්‍රී රෝද රථයක් - රු. 30.00

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:11** බළන්ගොඩ නගර සභාව සතු **ටෙන්ඩර් දැන්වීම් පුවරු අංක 01 සිට අංක 10** දක්වා දැන්වීම් පුවරු 10යේ බදු කාලය 2025 වර්ෂයේ අවසන් වන අතර 2026 වර්ෂය සඳහා ටෙන්ඩර් ක්‍රමවේද මගින් බදුකරුවන් තෝරා පත් කර ගැනීම.

| **දැ.පු. අංකය** | **ස්ථානය** | **අවසන්වරට ටෙන්ඩර් නිකුත්කළ වටිනාකම** | **ටෙන්ඩර් කලය අවසන්වන දිනය** | **අවසන් වරට ටෙන්ඩර් කරන ලද අවම මාසික ලංසු මුදල** |
|---|---|---|---|---|
| 01 | දෙරවල රා කඩය ඉදිරිපිට | රු. 4200.00 | අළුත්වැඩියා කලයුතුව ඇත. | රු. 4000.00 |
| 02 | දෙරවල රා කඩය ඉදිරිපිට | රු. 4250.00 | 2025.12.15 | රු. 4000.00 |
| 03 | දෙරවල රා කඩය ඉදිරිපිට | රු. 4320.00 | ටෙන්ඩර් කිරිමට ඇත | රු. 4000.00 |
| 04 | CTB බස්නැවතුමපල අසල | රු. 4250.00 | 2025.11.30 | රු. 4000.00 |
| 05 | මහජන බැංකුව ඉදිරිපිට | රු. 4700.00 | 2025.11.30 | රු. 4000.00 |
| 06 | තුඹගොඩ සමන් දෙව ප්‍රතිමාව අසල | රු. 4250.00 | 2025.11.30 | රු. 4000.00 |
| 07 | කොන්වන්ට් පාසල ඉදිරිපිට | රු. 2370.00 | 2025.11.30 | රු. 2000.00 |
| 08 | ඕලුගංතොට පාලම අසල | රු. 2250.00 | 2025.11.30 | රු. 2000.00 |
| 09 | සරස්වතී පාර අසල | රු. 2100.00 | 2025.12.31 | රු. 2000.00 |
| 10 | පල්ලෙකඹුර පාර පිවිසුම අසල | රු. 2380.00 | 2025.12.15 | රු. 2000.00 |

**අවසන් වරට ටෙන්ඩර් කිරීමට අදාළ විස්තර පහත පරිදි වේ.**

- ටෙන්ඩර් කරන ලද ක්‍රමවේදය - ප්‍රාදේශීය ටෙන්ඩර්
- ආපසු ගෙවන ලද ටෙන්ඩර් ඇප - රු. 2,000.00
- අයදුම්පත්‍ර ගාස්තුව - රු 1,000.00

ඒ අනුව ඉදිරි වර්ෂයක කාලයකට බදු දීම සඳහා ඉදිරි කටයුතු තීරණය කිරිම වෙනුවෙන් සහ අදාළ අනුමැතිය ලබාගැනිමට හා ටෙන්ඩර් කිරීමේ සුදුසු ක්‍රමවේදය පිළිබඳව තීරණය කරගැනීම.

දැන්වීම් පුවරු වල වර්තමාන තත්වය-දැන්වීම් පුවරු අංක 01 දැඩි සුළං තත්වය මත නැවී කඩා වැටීම නිසා කර්මාන්ත අංශය වෙත ගෙනවිත් භාරදී ඇති අතර, දැන්වීම් පුවරු අංක 02 ද සුළගට නැවී ඇත(මෙම දැන්වීම් පුවරු සවිකර ඇත්තේ දොරවල රා තැබෑරුම ඉදිරිපිට ඉවුරේය). මෙම දැන්වීම් පුවරු නිසි පරිදි ප්‍රතිසංස්කරනය කර නැවත ටෙන්ඩර් කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත දැන්වීම් පුවරු 10 ඉදිරිපත් කර ඇති අවසන් වරට ටෙන්ඩර් කරන ලද අවම ලංසු මුදල් යටතේ ප්‍රාදේශීය ටෙන්ඩර් ක්‍රමවේදය මඟින් ටෙන්ඩර් කිරීමටත් ප්‍රතිසංස්කරණය කළ යුතු දැන්වීම් පුවරු ප්‍රතිසංස්කරණය කර නැවත ටෙන්ඩර් කිරීමටත් ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**07:01:12** බලන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවතේ සවිකිරීම සඳහා සෝලා ලයිට් 10 ක් ආධාරක සමඟ මිලදී ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා කිරිදිගල කොට්ඨාශයේ අඳුරු ස්ථාන විශාල ලෙස පවතින බවත්, ඒ හේතුවෙන් මත්ද්‍රව්‍ය ජාවාරම ක්‍රියාත්මක වන බවත්, අවම වශයෙන් සූර්ය බල්බ 05ක් වත් කිරිදිගල කොට්ඨාශයට ලබා දෙන ලෙසත් ඉල්ලීම් කල අතර තවමත් කිරිදිගල කොට්ඨාශයේ නාගරික සංවර්ධන අධිකාරී ඉඩම අසළ ප්‍රදේශය සහ ශෛලතලාරාම මාර්ගයේ වීථි පහන් දැමීම සිදු නොකළ ස්ථාන පවතින බවත් පැවසීය.

ගරු සභාපතිතුමා පැවසුයේ වීථි පහන් 720ක ප්‍රමාණයක් මිලට ගත් බවත් විශාල ප්‍රමාණයක් දැනට අවසන් කරමින් යන බවත් එසේ තවදුරටත් බල්බ අවශ්‍ය ස්ථාන පිළිබඳව දැනුවත් කිරීම් සිදු කරන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒම්.ඒම් බී බණ්ඩාර මැතුතුමා පැවසූයේ එසේ එක් කොට්ඨාශයකට පමණක් සෝලා ලයිට් 05ක් ලබා දිය නොහැකි බවත් එසේනම් මන්ත්‍රීතුමන්ලා නියෝජනය කරන සෑම කොට්ඨාශයකටම බල්බ 05 බැගින් ලබා දිය යුතු බවත්ය.ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා මෙහිදී පැවසූයේ සෝලා ලයිට් සවිකළ යුත්තේ විදුලි සැපයුම ලබා ගත නොහැකි ස්ථාන සඳහා බැවින් විදුලි සැපයුම සහිත ස්ථාන සඳහා විදුලි බල්බම සවි කිරීම සුදුසු බවත් ඉහත යෝජනා කරන ලද

සෝලා ලයිට් 10 මොහාන් සාලිය එල්ලාවල මාවත සඳහා ප්‍රමාණවත් නොවන බැවින් එම සෝලා ලයිට් 20ක් මිලදී ගැනීම සුදුසු බවත්ය.ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ඉල්ලීම පසුව සලකා බැලීම සුදුසු බවන බවයි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ තමන් එම ඉල්ලීම කලේ ශෛලතාරාම මාවතේ එවැනි සෝලා ලයිට් සවිකළ යුතු ස්ථාන පවතින බැවින් බවත්, අනෙක් මන්ත්‍රීතුමන්ලාද තමන්ගේ කොට්ඨාශයට අවශ්‍යනම් ඉල්ලීම් යොමු කරන ලෙසත් එය ලබා දීම හෝ නොදීම සභාවේ තීරණයක් බවත්ය.

ඒ අනුව බළන්ගොඩ මොහාන් සාලිය එල්ලාවල මාවතේ සවිකිරීම සඳහා සෝලා ලයිට් 20ක් අවශ්‍ය ආධාරක සමඟ මිලදී ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කළ සංශෝධිත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:13** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කරමින්, චක්‍රීය ආර්ථිකයක් නිර්මාණය කිරීමෙහිලා එම ආයතන සතු වගකීම ඉටු කිරීම සම්බන්ධයෙන් බළන්ගොඩ නගර සභාව සඳහා හලර් යන්ත්‍රයක් මිලදී ගැනීමට රු.4,000,000.00ක ප්‍රතිපාදන වෙන් කර ඇත.ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ තමාගේ ධූරකාලයේදීද මෙම හලර් යන්ත්‍රය අලුත්වැඩියා කළ බවත්,වගකීමක් සහිත ස්ථානයකින් මිලදී ගැනීම් සිදු කිරීම අත්‍යවශ්‍ය බවත්ය.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:14** බළන්ගොඩ නගර සභාවට අයත් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා සතියේ දිනවලට සාපේක්ෂව සෙනසුරාදා දිනයන්වලදී පැමිණෙන රෝගීන් ප්‍රමාණය ඉතා අඩු බැවින් සෙනසුරාදා දින වසා දැමීම පිළිබඳවත් එම පැය ගණන සතියේ දිනවල විවෘතව තබන වේලාවට එකතු කිරීමත පිළිබඳවත් තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා පැවසුයේ සති අන්තයේ සෙනසුරාදා දිනයන් වලදී රජයේ සේවකයන් වැනි රෝගීන් පැමිණෙන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාද එම අදහස පැවසීය.ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත ඉල්ලීම ආයුර්වේද වෛද්‍යවරියගේ ඉල්ලීමක් බවත් සභාවේ මතය පිළිබඳ විමසීම් කිරීම සඳහා සභාව වෙත යොමු කළ බවත් ඒ අනුව සභාවේ මතය අනුව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන බවත්ය.

**07:01:15** කර්මාන්ත කාරක සභාවේ යෝජනා ස්ථිර වූ පරිදි මාර්ග නඩත්තු කටයුතු සඳහා ප්ලේට් කම්පැක්ටර් යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම් එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.**

**07:01:16** සභාව සතු ZA-5039 ජේ.සී.බී රථයේ අලුත්වැඩියා කිරීම සඳහා එහි නියෝජිත ආයතනය වන Avonsmart Engineering (pvt)Ltd වෙතින් ඉදිරිපත් කර ඇති රු.1,576,170.27 ක ඇස්තමේන්තුව අනුමත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා, ඉහත යෝජනාවට අදාළව අමුණා ඇති ඇස්තමේන්තුව පිළිබඳ පැහැදිලි කිරීමක් අවශ්‍ය බව පවසන ලදී.

ඒ අනුව එකී ඇස්තමේන්තුව පිළිබඳ වැඩ අධිකාරි මහතාගෙන් වැඩිදුර කරුණු පැහැදිලි කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත්කරන ලදී.

අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ සභාව සතු ZA-5039 ජේ.සී.බී රථයේ අලුත්වැඩියා කිරීම සඳහා එහි නියෝජිත ආයතනය වන Avonsmart Engineering (pvt)Ltd වෙතින් ඉදිරිපත් කර ඇති රු.1,576,170.27 ක ඇස්තමේන්තුව පිළිබඳ ගැටළු රාශියක් කාරක සභා අවස්ථාවේ ගරු සභිකවරුන්

ඉදිරිපත් කළ බැවින්, ZA-5039 ජේ.සී.බී රථය යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු වෙත යොමුකර වාර්තාවක් ලබා ගෙන මේ පිළිබඳ තීරණය කිරීම සුදුසු බවයි.

**07:01:17** බලංගොඩ මහජන බස් නැවතුම්පළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරිමේ සහ බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ අට්ටි ගැසීමේ ස්ථානය පුළුල් කිරීමේ කර්මාන්ත වලට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බලංගොඩ මහජන බස් නැවතුම්පළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරිමේ කර්මාන්තය සිදු කිරීම වෙනුවෙන් ලංසුපත් 03ක් නිකුත් වී තිබූ අතර එකී ලංසුපත් තුන පහත පරිදි ලැබී තිබුණි.

| අනු අංකය | ලංසුකරුගේ නම | ඉදිරිපත් කර ඇති ලංසු මුදල (රු.) |
|---|---|---|
| 01 | සසිරි කන්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයර්ස් | 14,046,100.00 |
| 02 | සැම් ඩැම් කන්ස්ට්‍රක්ෂන් | 14,346,309.90 |
| 03 | අනුර කන්ට්‍රක්ෂන් | 13,610,533.97 |

මෙම කර්මාන්තයට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- මෙම කර්මාන්තය සඳහා ලංසුපත් 03ක් පමණක් ඉදිරිපත් කර ඇත.මූලික ලංසු ඇගයීමේදී අරුණ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් මැන් පවර්,රාස්සගල පාර,පොල්වත්ත හංදිය, බළන්ගොඩ යන ආයතනය ලංසු ඇගයීමෙන් ඉවත් කරන ලදී.තවද සසිරි කන්ස්ට්‍රක්ෂන්, නො28, කිරිඳිගල , බළන්ගොඩ ආයතනයද ලංසුව ඉල්ලා ඇති සුදුසුකම් වන පිරිවැටුම්හි සාමාන්‍ය හා වැඩ පළපුරුද්ද යන සුදුසුකම් සපුරා නොමැති බැවින් ප්‍රතික්ෂේපිත ලංසුවක් සේ සලකන ලදී.එම නිසා මෙම කර්මාන්තය සඳහා සාර්ථක ලංසුකරු ලෙස සැම් ඩැම් ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්)ලිමිටඩ්, නො 82, කල්තොට පාර, බළන්ගොඩ යන ආයතනය සුදුසුකම් ලබයි.
- ඉහත නිරීක්ෂණයේ කරුණු සැලකිල්ලට ගත්කල මෙම කර්මාන්තය සඳහා සාර්ථක ලංසුකරු වනුයේ සැම් ඩැම් ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්)ලිමිටඩ්, නො 82, කල්තොට

පාර, බළන්ගොඩ යන ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු.14,346,309.93 ක මුදල යටතේ මෙම කර්මාන්තය පිරිනැමීමට නිර්දේශ කරමු.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු උප සභාපති  පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

බැංකියවත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ අට්ටි ගැසීමේ ස්ථානය පුළුල් කිරීමේ කර්මාන්තයට අදාළව ආයතන 3ක් වෙත ලංසුපත් 03ක් නිකුත් කර ඇති අතර, එම ආයතන 03 විසින් ලංසුපත් සම්පූර්ණ කර ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.

| අනු අංකය | ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වටිනාකම (රු) |
|---|---|---|
| 01 | සසිරි කන්ස්ට්‍රක්ෂන්ස් | 2,816,372.00 |
| 02 | අරුණ කන්ස්ට්‍රක්ෂන්ස් ඇන්ඩ් මෑන් පවර් | වලංගු ලංසු ඇපකරයක් / මුදල් තැන්පතු පත්‍රිකාවක් ඉදිරිපත් කර නොතිබුණි |
| 03 | චන්ද්‍රසිරි කන්ස්ට්‍රක්ෂන් | 2,740,000.00 |

මෙම කර්මාන්තයට අදාළව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

ඉදිරිපත් කළ ලංසු අතරින් අංක (1) හා (3) යන ලංසුපත් වලංගු ලංසු ඇපකරයන්/මුදල් තැන්පත් ඉදිරිපත් කර ඇති අරුණ කන්ස්ට්‍රුක්ෂන්ස් ඇන්ඩ් මෑන් පවර් ආයතනය වලංගු ලංසු ඇපකරයක් ඉදිරිපත් කර නොතිබුණි.ඉදිරිපත් කළ ලංසුපත්වල ගණිතමය නිවැරදිතාවය පරීක්ෂා කරන ලදී.වලංගු ලංසුපත් වල ලංසු බැඳුම්කරය කොන්දේසි ප්‍රකාරව ඉදිරිපත් කර ඇත.කොන්ත්‍රාත් ලියාපදිංචිය තහවුරු වී ඇත.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගත් කළ මෙම කර්මාන්තය සඳහා අවම සාරානුකූල ලංසුව ඉදිරිපත් කර ඇත්තේ චන්ද්‍රසිරි කන්ස්ට්‍රක්ෂන් , පන්සල පාර,බොරළුවගේ අයින,රක්වාන යන ආයතනය වන අතර එහි පිළිගත් ලංසු වටිනාකම රු.2,740,000.00කි. මෙම අගය ඉංජිනේරු ඇස්තමේන්තු වැඩ වටිනාකම සමග සැසඳීමේදී 6.33%ක අඩුවකි.ඒ අනුව මෙම කර්මාන්තය ඉහත සඳහන් ආයතනයට එහි පිළිගත් ලංසු වටිනාකම රු.2,740,000.00 ක මුදලට පිරිනැමීම සුදුසු බවට නිර්දේශ කරමු.

තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ

යෝජනාව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:02 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා**

**07:02:01** දොරවෙල පෞද්ගලික ටයර් කඩයක් ඉදිරිපිට යොදා ඇති කාණුව සම්බන්ධව මන්දගාමීව කටයුතු සිදු වීම සම්බන්ධව ගරු සභාවේ අවධානය යොමු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමන් පැවසූයේ දොරවෙල එන.කේ ටයර් කඩය අසල කාණුව මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බැවින් මෙම කාණුවේ ජලය මුගුණමලය මාර්ගයට ගලා යැම වැළැක්වීම සඳහා එම වැසි ජල කාණුව වෙනත් දිශාවකට යොමු කරන ලෙසට මාර්ග සංවර්ධන අධිකාරියට 2025.09.08 සහ 2025.10.17 දිනැතිව ලිපි යොමු කර ඇති බවයි.වැඩිදුරටත් ගරු සභාපතිතුමා මේ පිළිබඳ නැවතත් එම ක්‍රියාමාර්ග කඩිනම් කරන ලෙස දැන්වීමට වැඩ අධිකාරි මහතා වෙත උපදෙස් ලබා දෙන ලදී.

**07:02:02** අංක 240,හපුතලේ පාර, තුඹගොඩ,බළන්ගොඩ ලිපිනයේ පදිංචි ඉන්ද්‍රා මුත්තුවේල් යන අයට නගර සභාව මඟින් යොමුකර ඇති බනස/ක/3/17 හා 2025.07.17 දිනැති ලිපිය මඟින් හා 2025.08.07 දිනැති ලිපිය මඟින් යොමුකර ඇති කරුණ සම්බන්ධයෙන් වර්තමාන තත්වය පිළිබඳ සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ඒ.සී කීගල් මහතාගේ 4905 දරණ පිඹුරට අයත් කුඹුරු ඉඩම මායිමේ ඔහු විසින් ඉදිකරන ලද කාණුව මත එහි ජලය ගලා යාම අවහිර වන පරිදි එම කාණුවේ අනිත් පස සිටින වෙළඳසැල් හිමියන් කොන්ක්‍රීට් දමා ආවරණය කර ඇති බවට 2025.07.03 දිනැති ලිපිය මඟින් සභාව දැනුවත් කර ඇති බවත්, ඒ අනුව ඒ මත ඉදිකිරීම් සිදුකර ඇති වෙළඳසැල් හිමියන්ට වැඩ අධිකාරී නිර්දේශය මත අනවසර නිවේදන නිකුත් කර ඇති බවත්, 2025.07.17 සහ 2025.08.07 දිනැතිව එම අනවසර නිවේදන නිකුත් කර ඇති බවත්, පොදුවේ සියළු කඩ හිමියන්ට එම නිවේදන නිකුත් කළ අතර නො.204,තුඹගොඩ බළන්ගොඩ ලිපිනයේ පිහිටි ඉන්ද්‍රා මුත්තුවේල් යන අයද ඊට අයත් වන බවත්, නමුත් ඔහු එම ස්ථානයේ අනවසර ඉදිකිරීමක් කර නොමැති බව ඔහුගේ 2025.08.06 දිනැති ලිපියෙන් දන්වා ඇති බවත් , ඒ අනුව අදාළ ස්ථානය නැවත පරීක්ෂා කරන ලදුව එම වෙළඳසැළ පිටුපස කාණුව මත අනවසර ඉදිකිරීමක් කර නොමැති බව තහවුරු වී ඇති බවත් ගරු සභාපතිතුමා මේ පිළිබඳ කරුණු පැහැදිලි කරමින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ එම ස්ථානයේ අනවසර ඉදිකිරීමක් නොමැතිනම් අනවසර නිවේදන යැවීම සම්බන්ධව ඔහුට සභාවට විරුද්ධව නීත්‍යානුකුල

ක්‍රියාමාර්ග ගත හැකි බවත්, ඉන්ද්‍රා මුත්තුවේල් යන අය අනවසර ඉදිකිරීමක් කර නොමැති බවත්,නමුත් මෙම ස්ථානයේ තවත් අනවසර ඉදිකිරීම් පවතින බවත්, ඒ පිළිබඳ ක්‍රියාමාර්ග නොගැනීම ගැටළුවක් බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා මේ සම්බන්ධව නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන ලෙස දන්වන ලදී.

**07:02:03** කසළ රථයට විෂ කවර ලබා දීම හේතුවෙන් රෝගාතුර වූ සේවකයන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මීට අදාළව වගකිව යුතු ආයතනය වන ඉසුරු ගොවි සේවා ආයතනය ගෙන්වා සාකච්ඡා කර එම විෂ හේතුවෙන් රෝගාතුර වූ සේවකයන් තිදෙනෙකු හට දිනකට රු.1900.00 බැගින් දින දෙකක් සඳහා වැටුප් ලබා දී ඇතිබව ගරු සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා මෙම සේවකයන් වෙත වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත්ද යන්න විමසීම් කිරීමත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා එසේ ලබා දුන් මුදල ප්‍රමාණවත්ද යන්න විමසීමත් සමඟ මේ සම්බන්ධව මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගෙන් වැඩිදුර කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

ඒ අනුව අදාළ කරුණු පැහැදිලි කර ගැනීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව කාරක සභාවේ සාකච්ඡා කරගත් කරුණු අනුව ඉසුරු ගොවි සේවා ආයතනය ගෙන්වා නැවත සිදු වූ ගැටළුව පිළිබඳ සාකච්ඡා කර සේවකයන් වෙත ප්‍රතිලාභයක් ලබා දීමේ කටයුතු සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා පැවසීය.

**07:02:04** වැලිහරනාව සංජීව මහතාගේ නිවෙස් වලට යන මාර්ගය සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**07:02:05** මුගුණමලය මාර්ගය ගලපල්ලෙඅරාව, ශෛලතලාරාම මාර්ගය දක්වා නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්.හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මෙම 07:02:04 , 07:02:05 යන යෝජනා කර්මාන්ත කමිටුවට ඇතුළත් කර අනුමැතිය ලබා ගත් බවත් වැරදීමෙන් නැවත මෙම සභාවේ යෝජනා තුළට ඇතුළත් වී ඇති බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ නිලධාරීන් ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතු බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා,එතුමා අවසාන සභා වාරයට තමන් කිසිඳු යෝජනාවක් ලබා නොදුන් බවත්, පෙර ලබා දුන් යෝජනා ක්‍රියාත්මක වෙනවාද යන්න සලකා බලන බවත්, නැවත නැවත දීම එලක් නොවන බවත්, එසේ යෝජනා ලබා නොදෙන්නේ යෝජනා ක්‍රියාත්මක වීම ප්‍රමාද වන හේතුවෙන් බැවින් ඒවා ක්‍රියාත්මක කරවීමට සභාපතිතුමාගේ මැදිහත්වීම ලබා දෙන ලෙසත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ සභාවන් වලදී යෝජනා කරන යෝජනා සියල්ලම ක්‍රියාත්මක කරවීමට ප්‍රායෝගිකව හැකියාවක් නොමැති බවත්, නමුත් අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු යෝජනා ක්‍රියාත්මක කරවීම සිදු කරන බවත්, යෝජනාවක් සිදු කර ඇති විටදී ඒවා ක්‍රියාත්මක වන්නේ දැයි විෂය නිලධාරීන් සමඟ සම්බන්ධ වී අවශ්‍ය කටයුතු සිදු කර ගැනීමට මන්ත්‍රීතුමන්ලා සභාව වෙත පැමිණෙන ලෙසත්ය.එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමාගේ යෝජනාවක් වන සමඟි මාවත සංවර්ධනය කිරීමට වන යෝජනාව පිළිබඳ ගරු සභාපතිතුමා සිහිගැන්වීමත් සමඟම ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා බලන්ගොඩ නගර සභාවේ වැඩිම ජනගහනයන් වන පවුල් 458ක පමණ සංඛ්‍යාවක් නියෝජනය වන තමාගේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා ලෙස සමඟි මාවත අක්කර 18 යන යෝජනාව පළමු සභා වාරයේදී ලබා දුන් නමුත් ගරු සභාපතිතුමා එම යෝජනාව ඉවත් කර ඉතිරි යෝජනා ඇතුළත් කර තිබූ බවත්, නමුත් ගැටළුවක් නොවන බවත්, අවශ්‍යවන්නේ කවර හෝ අයෙකු පැමිණ ගමට වැඩ කිරීම බවත් පවසන ලදී. එසේම දෙහිගස්තලාව අලාබ්දීන් මාවත සංවර්ධනය කිරීමට රු.ලක්ෂ 10ක් පැමිණ ඇති බවත්,එම කර්මාන්තය සභාවේ මන්ත්‍රීතුමෙකුගේ නමට භාර දී තිබේද යන්න ගරු සභාපතිතුමාගෙන් විමසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ එසේ කිසිඳු අයෙකුට ලබා දී නොමැති බවයි. මෙම මාර්ගයේ වීරසිංහ මහතා සහ ලලිතා මහත්මිය යන ප්‍රදේශවාසීන් සමඟි මාවත පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර ඇති බවත්,ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේද මෙම යෝජනාව අන්තර්ගත වූ බවත්, ඒ අනුව මුලදී මෙම යෝජනාව ප්‍රමාද කිරීමට හේතුව වන්නේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා හරහා මෙම මාර්ගය සඳහා කාර්පට් ව්‍යාපෘතියක් ඉල්ලුම් කිරීම බවත්, ඒ අනුව එයට අනුමැතිය ලැබී ඇති බවත්, මුදල් ලැබී ඇති බවත්,ඒ සඳහා ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කළ යුතු බවත් අනුමැතිය ලද සැණින් එම කර්මාන්තය ආරම්භ කරන බවත්ය.

එමෙන්ම සභාව තුළ යෝජනා ඉදිරිපත් කර ක්‍රියාකාරීව සභාව සමඟ සම්බන්ධ වී වැඩ කටයුතු සිදු කර ගැනීම නිතරම දකින්නේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගෙන් බවත් ගරු සභාපතිතුමා වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසුයේ සභාපතිතුමාගේ දැන්වීම් පරිදි මුස්තාපා මාවත සහ සුබයිර් අලීම් මාවත යන මාර්ග අළුත්වැඩියා යෝජනා ලෙස භාරදුන් බවත්, ඒ අනුව පසුව සභාපතිතුමා තමාගේ ඉදිරිපත් කළ මුස්තාපා මාවත යෝජනාව සඳහා මුදල් ලැබී ඇති බව පැවසු බවත්ය.

මෙහිදි ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා සභාපතිතුමා එසේ ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාට පමණක් පවසන්නේ කෙසේදැයි විමසීමත් සමඟ සභාවේ ඝෝෂාවක් ඇතිවිය.මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ එසේ සිදුවීමක් නොමැති බවත්,පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන ප්‍රතිපාදන සඳහා මෙම මාර්ගය නඩත්තු කිරීමද යොමු කළ බවත්, මෙම මාර්ගය නඩත්තු කිරීම පිළිබඳ ඉල්ලීම් මෙම මන්ත්‍රීතුමන්ලා දෙදෙනාට අමතරව තවත් අයගේ ඉල්ලීම් ලැබුණ බවත්, එසේම එම වෙන් කළ ප්‍රතිපාදන මත සඳුන්ගම මාර්ගය සහ පරගහකුඹුර මාර්ගය නඩත්තු කිරීමද ඇතුළත් බවත්,එසේම අලාබ්දීන් මාවත නඩත්තු කිරීම මන්ත්‍රීතුමන්ලා දෙදෙනාගේම ඉල්ලීම් සලකා සිදුකරන බවත්, මෙම දිනවල එම නඩත්තු කිරීම් වලට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසුයේ අවශ්‍ය වන්නේ කෙසේ හෝ ජනතාවට සේවාවක් සිදු වීම බැවින් එම වැඩ කටයුතු සිදු විය යුතු බවයි. මෙහිදී කොට්ඨාශවලට අදාළ නඩත්තු සහ සංවර්ධන කටයුතු සිදු කිරීමේදි අදාළ කොට්ඨාශය නියෝජනය කරනු ලබන මන්ත්‍රීතුමන්ලා ඒ සඳහා සහභාගී වන ලෙසත් එම සේවකයන් සිදු කරන කාර්යය නිසි පරිදි සිදු කරන්නේදැයි සොයා බැලීම සිදු කරන ලෙසත් ගරු සභාපතිතුමා දැනුම් දෙන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසුයේ පසුගිය සභා වාරවලදි කොට්ඨාශයක වැඩ සිදු කිරීමේදි කොට්ඨාශය නියෝජනය කරන නාගරික මන්ත්‍රීතුමා දැනුවත් කරන ලෙස ගරු සභාපතිතුමා වෙත දැනුම් දුන් බව පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ කිරිදිගල කොට්ඨාශයේ අත්‍යවශ්‍ය යෝජනාව කුමක්ද යන්න විමසීමේදී ලබා දුන් යෝජනාව නොව වෙනත් යෝජනා සිදු වී ඇති බවත්, නඩත්තු යෝජනාවක් ක්‍රියාත්මක කිරීමේදී එම ප්‍රදේශයේ ජනගහනය, ආදී සාධක සලකා බලා සක්‍යතා අධ්‍යයනයක් සිදුකර එම නඩත්තු සිදු කරන ලෙසත් එසේ නොමැති නම් මහජන මුදල් නාස්ති කිරීමක් විය හැකි බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා වෙත කිරිදිගල කොට්ඨාශයේ සිදු කරනු ලබන මාර්ග නඩත්තු පිළිබඳ වැඩ අධිකාරී මහතාගෙන් කරුණු පැහැදිලි කරගැනිම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

වැඩ අධිකාරී මහතාගෙන් අදාල කරුණු පැහැදිලි කරගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:03 ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:03:01** අනඳමෙත්ගම එඩ්වඩ් මහතාගේ නිවස අසලින් පහළ මාර්ගය සම්බන්ධ කිරීමට ඇති මාර්ගයේ මායිම් හා අනඳමෙත්ගම ප්‍රජා ශාලාව අසලින් ඉහළ මාර්ගයේ වමින්ද තෙන්නකෝන් මහතාගේ නිවස අසලින් ජල ටැංකියට ඉදිරිපස මාර්ගයේ මායිම් නැවත සළකුණු කර දෙන ලෙස ප්‍රාදේශීය මිනින්දෝරු අධිකාරී වෙත මැණුම් ඉල්ලීමක් යොමු කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමන් ඉහත යෝජනාව පිළිබඳ ස්ථානිය පරීක්ෂණයක් සිදු කරන ලෙස දැනුම් දෙන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:02** මුගුණමලය-අනඳමෙත්ගම මාර්ගය ජාතික මැනුම් ජාලයට ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය මැණුම් අධිකාරී වෙත ඉල්ලීම් කිරීමට සහ එම යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන්, නාගරික සංවර්ධන අධිකාරියේ ඉදිරි 2026-2036 සැලසුම සභාව වෙත ඉදිරිපත් කර ඇති බැවින් සියළුදෙනාම එම සැලසුම පරිශීලනයක් සිදුකරන ලෙසත්, එයට අවශ්‍ය සංශෝධන සහ යෝජනා ඉදිරිපත් කිරීම් කළ හැකි බවත් සභාව දැනුවත් කරමින් පැවසීය.

තුඹගොඩ ප්‍රදේශය නිතරම මාර්ග තදබදයට ලක්වන බැවින් සහ හදිසි අවස්ථාවකදී නගරය මඟහැර ගමන් කළ හැකි හොඳම විකල්ප මාර්ගයක් වන මුගුණමලය-අනඳමෙත්ගම මාර්ගය ජාතික මැනුම් ජාලයට ඇතුළත් කිරීමට සහ නාගරික සංවර්ධන අධිකාරියේ ඉදිරි 2026-2036 සැලසුම් වලට ඇතුළත් කිරීම සුදුසු බවටත් මැණුම් ඉල්ලීම යොමු කිරීමටත් එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා යෝජනා කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:03** අප විසින් ලබා දුන් නඩත්තු යෝජනා වලින් කොපමණ ප්‍රමාණයක් මේ වන විට නඩත්තු කර අවසන්ද යන්න පිළිබඳව හා මේ වර්ෂයේදී සිදු කිරීමට අපේක්ෂිත ප්‍රමාණය කොපමණද යන්න සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පහත පරිදි කර්මාන්ත ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී.

| අනු අංකය | කර්මාන්තය | මේ වන විට තත්ත්වය |
|---|---|---|
| 1 | කිච්ලෙවෙල ළිඳ ප්‍රතිසංස්කරණය කිරම | වැඩ අවසන් |
| 2 | කිරිදිගල ජනපද පාර නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 3 | උසාවි මාර්ගය නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 4 | පොලිසිය ඉදිරිපිට මාර්ගය නඩත්තු කිරීම | කොටසක වැඩ අවසන් |
| 5 | බුද්ධ ජයන්ති විද්‍යාල මාර්ගය නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 6 | ඇවිදින මංතීරුව හා ක්‍රීඩා භාණ්ඩ ප්‍රතිසංස්කරණය හා අඩුපාඩු සැකසීම | ක්‍රීඩා භාණ්ඩ ද්‍රව්‍ය මිලදී ගැනීමට කටයුතු යොදා ඇත. |
| 7 | බෝම්බුව පහළ මස්සැන්න මාර්ගය නඩත්තු කිරීම | මෙම කර්මාන්තය සඳහා ප්‍රා.ලේ.කාර්යාලය මඟින්ද ප්‍රතිපාදන වෙන් කර ඇත. |
| 8 | මුගුණමලය පාලම නඩත්තු කිරීම | ඉදිකිරීම් කටයුතු කරමින් පවතී. |
| 9 | ළමා උද්‍යානයේ ක්‍රීඩා භාණ්ඩ අළුත්වැඩියා කිරීම | අවසන් කර ඇත. |
| 10 | ඇල්ලේරාව එක්සත් මාවත නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 11 | සුදර්ශන පුර මාර්ගය නඩත්තු කිරීම | නඩත්තු කටයුතු ආරම්භ කර ඇත. |
| 12 | බුලත්ගම සුසාන භූමිය සුද්ධකිරීම | තණකොල බෙහෙත් යොදා තණකොල කපා සුද්ධ කර අවසන් |
| 13 | දෙවට පාර නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 14 | ගමගෙදර පාර නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 15 | සදුන්ගම මාර්ගයනඩත්තු කිරීම | වැඩ අවසන් |
| 16 | සුනන්දාරාම මාවත ප්‍රිම්ක්ස් යෙදීම | වැඩ අවසන් |
| 17 | බෝම්බුව පරගහකුඹුර මාර්ගය අළුත්වැඩියා කිරීම | කර්මාන්තය ආරම්භ කර ඇත. |
| 18 | මාලිගාතැන්න සරස්වතී මාර්ගයේ පැතිබැම්ම ඉදිකිරිම | කර්මාන්තය ආරම්භ කර ඇත. |
| 19 | කිරිදිගල මැද පාර අවසන් කොටස සංවර්ධනය කිරීම | කර්මාන්තය ආරම්භ කර ඇත. |
| 20 | කහටපිටිය මුස්තාපා මාවත සංවර්ධනය කිරීම | කර්මාන්තය ආරම්භ කර ඇත. |
| 21 | වෑ කුඹුර මාර්ගය සංවර්ධනය කිරීම | කර්මාන්තය ආරම්භ කර ඇත. |

| | | |
|---|---|---|
| 22 | හුනුකුඹුර කෝපිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම | ගිවිසුම්ගත වී ඇත. |
| 23 | බළංගොඩ බස් නැවතුම් පොළ වැසිකිළි පද්ධතිය අ.වැ.කි | ගිවිසුම්ගත වී ඇත. |
| 24 | කොටුගොඩැල්ල කොටුව පාර සංවර්ධනය කිරීම | ගිවිසුම්ගත වී ඇත. |
| 25 | දෙහිගස්තලාව තලාව මාර්ගය නඩත්තු කිරීම | වැඩ අවසන් |
| 29 | අනඳමෙත්ගම 1 පටු මහ නො.49 නිවස දක්වා නඩත්තු කිරීම | ආරම්භ කර ඇත |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ බුලත්ගම සුසානභූමිය වැඩ අවසන් බවට පැවසුවද එහි වැඩ අවසන් නොවන බවත්, පළමු සභාවාරයේ සිට මේ දක්වාම මේ පිළිබඳව සාකච්ඡා කරන බවත්, එම සුසානභූමියේ පවතින ඉතාම අබලන් තත්වයේ පවතින ස්මාරක ගරා වැටී ජරාජීර්ණව පවතින බවත්, එම ස්මාරක හිමිකරුවන් දැනුවත් කර ඒවා ඉවත් කිරීමට පියවර ගන්නා ලෙසත්, තමාගේ කොට්ඨාශයේ නොවුවද පොදු මහජනයාගේ සුභසිද්ධිය තකා මෙම යෝජනාව ඉදිරිපත් කළ බවත්, එම කටයුතු සිදු කර අවසන් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත්ය.

ගරු සභාපතිතුමා මෙහිදී පවසා සිටියේ මෙම බුලත්ගම සුසානභූමියේ සුද්ද කිරීම් සිදුකර අවසන් බවත්,තවදුරටත් සිදු කළ යුතු නඩත්තු ලෙස ගස් කපා ඉවත් කිරීම පවතින බවත්, මෙහි ඇති අනාරක්ෂිතතාවය හේතුවෙන් ජල, විදුලි සැපයුම ආදිය සිදුකිරීම පිළිබඳ නැවත සලකා බැලිය යුතු බවත්, මේ පිළිබඳව පොලිසිය සමඟ සාකච්ඡා කළ බවත්, ඒ අනුව ඉදිරි පියවර ගන්නා බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සුනන්දාරාම මාර්ගයේ වැඩ අවසන් නොවන බව පැහැදිලි කරන ලදී.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා බුද්ධ ජයන්ති මාර්ගයේ වැඩ අවසන්ද යන්න විමසීම් කරන ලදී.ඒ අනුව ඒ පිළිබඳ වැඩිදුර කරුණු වැඩ අධිකාරී මහතාගෙන් විමසීම පිණිස ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව අදාළ කරුණු විමසීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:03:04** සනීපාරක්ෂක පහසුකම් හා ප්‍රාග්ධන වියදම් සඳහා 2025 වර්ෂයේ වෙන්කර ඇති මුදල් ප්‍රමාණය සහ මේ වන විට වියදම් කර ඇති ප්‍රමාණයන් පිළිබඳව හා සභා ආදායම් පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව ගරු සභාපතිතුමා පහත පරිදි සාරාංශගතව තොරතුරු ඉදිරිපත් කරන ලදී.

| | 2025 අයවැය | සත්‍ය වියදම(2025.09.29) | ඉතිරිය |
|---|---|---|---|
| සෞඛ්‍ය හා සනීපාරක්ෂක සේවා | 8,500,000.00 | 5,464,800.00 | 3,035,200.00 |

<u>ප්‍රාග්ධන වියදම්</u>

| | 2025අයවැය | සත්‍ය වියදම(2025.09.29) | ගෙවීමට ඇති බිල්පත් හා රැඳවුම් | ඉතිරිය |
|---|---|---|---|---|
| සංවර්ධන කටයුතු ( සභාඅරමුදල් ) | 14,100,000.00 | 4,319,874.16 | 2,006,930.00 | 7,773,195.84 |
| | 14,100,000.00 | 4,319,874.00 | | 7,773,196.00 |

මෙහිදී ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ ඉල්ලීම වූයේ ඉහත 2025 අයවැය අනුව සංවර්ධන කටයුතු වෙනුවෙන් වෙන්කර ඉතිරිව පවතින අරමුදල් ශේෂයක් පවතින බැවින් එම මුදල් යොදාගෙන මන්ත්‍රී ප්‍රතිපාදන එක් මන්ත්‍රීවරයෙකුට රු.ලක්ෂ 05 බැගින් වෙන් කළ හැකි බැවින් එය සිදු කර දෙන ලෙසයි.

ගරු සභාපතිතුමන් පැවසුයේ ත්‍රීරෝද රථය මිලදී ගැනීමට අනුමැතිය ලැබී ඇති බැවින් ඉදිරියට එම මිලදී ගැනීම් වෙනුවෙන්ද , සභාවට පවතින විහාල ගැටළුවක් වන වාහන නැවැත්වීමට සුදුසු නිශ්චිත ස්ථානයක් නොමැති වීම මතට පිළියමක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සතු ඉඩම ඉල්ලීම් කර ඇති බැවින් ඒ වෙනුවෙන් යෙදවීම වෙනුවෙන්ද අරමුදල් අවශ්‍ය බවත්, ඒ හේතුවෙන් මන්ත්‍රී ප්‍රතිපාදන මේ අවස්ථාවේ ලබා දීමට හැකියාවක් නොමැති බවත්, එමෙන්ම ඉදිරි අයවැය තුළින් ලැබීම් වලින් 60%ක ප්‍රමාණයක් වැටුප් වෙනුවෙන් වෙන් කිරීමට සිදුවන බවත් ,2026 අයවැය සකස්කිරීම පිළිබඳ සාකච්ඡාවක් ඉදිරි දිනයකදී පැවැත්වීමට නියමිත බැවින් එයට සම්බන්ධ වන ලෙසත් ය.

**07:03:05** දොරවෙල ඔයට විශාල ලෙස ගල් යොදා ඔය පටු කරන පුද්ගලයන් සම්බන්ධව නෛතික ක්‍රියාමාර්ග නොගැනීම පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ දොරවෙල ඔයට ඉහත පරිදි ගල් යොදා ඔය පටුකරන පුද්ගලයන් වෙත 2025.10.10 දිනැතිව එම ගල් ඉවත් කරන ලෙස ලිපි නිකුත් කර ඇති බවත්, මෙම ස්ථානය

නිරීක්ෂණය කළ බවත්,අදාළ පුද්ගලයා මේ වෙනුවෙන් සභාවේ ජේ.සී.බී රථය කුලී පදනම මත ලබා දෙන ලෙස ඉල්ලීම් කළ බවත් එම ගල් ඉවත් කර දෙන බව පැවසූ බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසා සිටියේ ස්වභාවධර්මය විපතක් සිදු කිරීමේදී පාට පක්ෂ බේද නොසලකන බවත්, දොරවෙල ඔය පිටාර ගැලුවොත් නගරය සම්පූර්ණයෙන් යට වන බවත්, දොරවෙල ඔයට ඉහත පරිදි ගල් යොදා ඔය පටුකර ඇති පුද්ගලයාට පෞද්ගලික ජේ.සී.බී රථයක් ලබාගෙන මෙය ඉවත් කිරීම කළ හැකි බවත්, ඉතා කඩිනමින් මෙම කාර්යය සිදු විය යුතු බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා පැවසුයේ අදාළ පුද්ගලයා සමඟ සාකච්ඡා කර කඩිනමින් එම කාර්යය සිදු කිරීමට උපදෙස් ලබා දීම සිදු කරන බවයි.

**07:03:06** සෝලා 20W සූර්යය පැනල බල්බ 14 ක් GI බට ආධාරකය සහිතව ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත ඉල්ලීම පිළිබඳ පසුව සලකා බලන බවයි.

**07:03:07** අනඳමෙත්ගම නො.49 නිවස දක්වා මාර්ගය නඩත්තු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07: 04 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්. චන්දන මැතිතුමා**

**07: 04:01** තුඹගොඩ සාංඝික මහා විහාරස්ථානය ඉදිරිපිට ඇති දැනට දැන්වීම් ඇලවීම සඳහා භාවිතා කරන පුවරුව අනතුරුදායක මට්ටමක ඇති බැවින් එය ඉවත් කර නගර සභාවේ දැන්වීම් පුවරුවක් ඉදිකිරීමට කටයුතු කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:02** රාස්සගල පාර පල්ලෙවෙල ලිපිනයේ පදිංචි ජයතිලක මහතා විසින් මින් පෙර සභාව වෙත ඉදිරිපත් කර ඇති ලිපියෙහි සඳහන් පරිදි සෝදා පාලුවට ලක්වන ඉඩමෙහි පැති බැම්ම සකස් කර දීම.මෙහිදී අත්තිවාරම පමණක් යොදා දෙන්නේනම් ප්‍රමාණවත් වේ.නිවසට

පැමිණෙන මාර්ගය සභාව වෙත පවරා ඇත.එහි පැති බැම්මෙන් නිම කර ඇත්තේ අඩක් පමණි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසා සිටියේ ඉහත යෝජනාවෙන් ඉදිරිපත් කර ඇති පල්ලෙවෙල වෙල අද්දර මාර්ගය අවස්ථා දෙකකදී සභාවෙන් සංවර්ධනය කළ බවත්, මෙම මාර්ගයේ පොදු කොටස සංවර්ධනය කර අවසන් බවත් ඉතිරිව ඇත්තේ පෞද්ගලික මාර්ග කොටස බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම මාර්ගය සභාවට පවරා දුන්නේ තමාගේ ධූරකාලයේ බවත් එහි පොදු කොටස පමණක් පවරා දුන් බවත් පවසන ලදී.

ඒ අනුව යෝජනාවෙන් ඉදිරිපත් කර ඇති මාර්ග කොටස පෞද්ගලික මාර්ගයක් බැවින් එහි සංවර්ධන කටයුතු සිදු කළ නොහැකි බවට සභාවේ තීරණය විය.

**07:04:03** මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ගල්වලට ඉහළින් ඇති නිවෙස් සඳහා ගමන් කිරීමට පඩිපෙළෙහි අබලන්ව ඇති පඩි සහිත ස්ථානය සකස් කිරීම සහ ඉතිරි පඩි කිහිපය සකස් කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.හෙට්ටිආරච්චි මැතිතුමා ඉහත යෝජනාව කිරිදිගල කොට්ඨාශයට අයත් බව පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා මෙම පඩිපෙළ මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් සැකසූ බවත්, ඒ අනුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කර මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීම සුදුසු බවත් පවසන ලදී.

ඒ අනුව ඉහත යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කර මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:05 ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී එන් සේනාරත්න මැතිතුමා**

**07:05:01** ආයුර්වේද ගොඩනැගිල්ලේ සිංහල බෙහෙත් ඔසු අලෙවිසලක් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා අදහස් දක්වමින්, මෙම යෝජනාව නව ආදායම් උත්පාදන මාර්ගයක් බවත්, සිංහල බෙහෙත් අලෙවිසල් බළන්ගොඩ නගරයේ පවතින නමුත් ඉන් එහා ගිය සංකල්පයක් මත ආයුර්වේද ගොඩනැගිල්ලේ සිංහල බෙහෙත් ඔසු අලෙවිසලක් ආරම්භ කළ හැකි බවත්,ආරම්භයේදීම මෙය විධිමත්ව පද්ධතියක්

ඔස්සේ ක්‍රියාත්මක කරමින් පවත්වාගෙන යාමට අවශ්‍ය බවත්, මිලියන 1 ක පමණ වියදමක් සිදුවනු ඇති බවත්,නමුත් හොඳ ආදායම් මාර්ගයක් බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා මෙහිදී අදහස් දක්වමින් පැවසුයේ නාගරික සංවර්ධන අධිකාරීය මෙම ආයුර්වේද ගොඩනැගිල්ල, නගර සභා නිල නිවාස සහිත ඉඩම පවරා ගැනීමට බලාපොරොත්තු වන බවත්,එසේ පවරා ගැනීමට එකඟ නොවන නමුත් එහි අවසරය මේ සඳහා ලබා ගත යුතු බවත්ය.

මෙම සභාව සතු නිල නිවාස සහ ආයුර්වේදය අතර මාර්ගය ඉදිරියේදී අඩි 40ක මාර්ගයක් ලබා දෙන ලෙස මුල සිටම ඉල්ලීම් කළ ඇති බවත්, එය අනුමත කර ගන්නා ලෙසත් , එවිට සභාවේ ඉඩම තුළ විශාල වෙළඳ සංකීර්ණයක් ඉදිකිරීමේ හැකියාවක් පවතින බැවින් එසේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම ඉඩම් පවරා ගැනීමට ලබා නොදෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසීය.

මේ අවස්ථාවේ නාගරික සංවර්ධන අධිකාරියට සභාව භුක්ති විඳින ඉඩම් පවරා ගැනීමේ හැකියාවක් තිබේද යන්න සම්බන්ධව සභාවේ සාකච්ඡාවක් ඇතිවිය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:02** ආයුර්වේද මධ්‍යස්ථානයේ ආයුර්වේද රූපලාවන්‍ය කර්මාන්තය සිදු කර ගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මෙහිදී පැවසුයේ පසුගිය වර සභාවේ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා ඉදිරිපත් කළ Street Food Festivel පැවැත්වීමේ යෝජනාව සහ ඉහත ආයුර්වේද මධ්‍යස්ථානයේ ආයුර්වේද රූපලාවන්‍ය කර්මාන්තය සිදු කිරීම යන යෝජනා ඉතාම ඵලදායි යෝජනා බවත් එවැනි යෝජනා සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී එන් සේනාරත්න මැතිතුමා ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින්, මෙය next level concept එකක් බවත් ඉදිරියට මෙම බළන්ගොඩ නගරය tourism hub එකක් බවට අනිවාර්යෙන් පත්වන බවත්, බළන්ගොඩ නගරය තුළද සැලකිය යුතු කාන්තාවන් පිරිසක් සිටින බැවින්, ආයුර්වේද රූපලාවන්‍ය සංකල්පය බළන්ගොඩ කිසිඳු පෞද්ගලික රූපලාවන්‍ය මධ්‍යස්ථානයක ක්‍රියාත්මක නොවන බවත් ඒ අනුව මෙම සාධක සලකා බැලීමේදී මෙයට හොඳ වෙළඳපළක් පවතින බවත් සඳහන් කරනලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05:03** රිෂානා සර්විස් මාර්ගය දැඩි ලෙස අබලන්ව ඇති බැවින් තාර යොදා පිළිසකර කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06** **ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

**07:06:01** බළන්ගොඩ ගොරොක්ගහමඩ එෆ්.එච් මාවතට පිවිසෙන මාර්ගය තද බෑවුම් සහිත මාර්ගයක් වන අතර මාර්ගයේ සෑම තැනකම මේ වන විට විශාල වළවල් සෑදී ඇත.මෙම මාර්ගය කඩිනමින් අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:02** බළන්ගොඩ මූලික රෝහලේ ඉදිරිපිට ස්ථිර මගී ආවරණය ස්ථාපිත කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:03** බළන්ගොඩ එෆ්.එච් මාවත උඩ කොටස වතුරු ටැංකිය පාර සිට මුස්තාපා මාවතට පිවිසෙන මාර්ගයේ කොටසක් අබලන් වී ඇත(යාර 100 ක් පමණ දුර ප්‍රමාණය ).මෙම මාර්ග කොටස ප්‍රිමික්ස් යොදා සංවර්ධනය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:04** බළන්ගොඩ කහටපිටිය මාර්ගයේ අතුරු මාර්ගයක් වන සුබයිර් අලීම් මාවත කඩිනමින් අළුත්වැඩියා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:07 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:07:01** දීර්ඝකාලීනව පදික වෙළඳාමේ නිරතව කිසිඳු අවස්ථාවක කඩ කාමර නොලැබුණු පදික වෙළඳුන් හඳුනාගෙන ඔවුන්ට ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා ලංකා බැංකුව සහ කොමර්ෂල් බැංකුව අතර නාගරික සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය දෙපස පමණක් ඉඩ ලබා දීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව පවසා සිටියේ මෙම පදික වෙළඳාම පිළිබඳ ගැටළුව රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා වෙත යොමුකර ඇති බවත් එම වෙළඳුන්ද එතුමා පෞද්ගලිකව මුණගැසී ලිපි භාරදී ඇති බවත්, ඒ අනුව එතුමා සාකච්ඡා කර විසඳුමක් ලබා දෙනු ඇති බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසා සිටියේ සභාව මඟින් අවස්ථා දෙකකදී පදික කඩ කාමර ලබා දුන් නමුත් එම කිසිඳු අවස්ථාවක කඩ කාමර නොලැබුන පදික වෙළෙන්දන් කිහිප දෙනෙකු සිටින බවත්, එම වෙළෙඳුන් සඳහා ලංකා බැංකුව සහ කොමර්ෂල් බැංකුව අතර නාගරික සංවර්ධන අධිකාරියට අයත් මාර්ගය දෙපස පමණක් වෙළඳාම් කිරීම වෙනුවෙන් ලබා දෙන ලෙස වෙළඳුන් ඉල්ලීම් කරන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ පදික වෙළඳාමේ නිරත වන වෙළෙන්දන්ගෙන් පදික කඩ හිමි අය සහ කිසිඳු අවස්ථාවක පදික කඩ නොලැබුන පිරිස සම්බන්ධව සමීක්ෂණයක් සිදු කිරීම සුදුසු බවත් ඒ අනුව පසුව ඒ පිළිබඳ තීරණය කළ යුතු බවත් දැනට කිසිඳු පදික වෙළඳාමක් සිදු කිරීමට අවසර ලබා දිම කළ නොහැකි බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා මෙහිදී පවසා සිටියේ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන පරිදි පදික වෙළඳාම ඉවත් කිරීම මඟින් කඩ කාමර නොලැබුන පිරිස් වෙත ඔවුන්ගේ ආර්ථික තත්වය සලකා යම් සාධාරණයක් කිරීම සුදුසු බවයි. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ තමන් යෝජනා කළ මාර්ගයේ එසේ අසරණ වී සිටින වෙළඳුන් කිහිපදෙනා වෙනුවෙන් වෙළඳාම් කිරීමට අවස්ථාව ලබා දීම සුදුසු බවත්, එම මාර්ග කොටස සභාවේ නොවන බැවින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අවශ්‍ය ඉදිකිරීම් කිරීමේදී ඊට අදාළ පියවර ගනු ඇති බවත් තාවකාලිකව හෝ එම අවස්ථාව සලසා දීමට ගරු සභාපතිතුමාට හැකියාව පවතින බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා කාගිල්ස් ෆුඩ් සිටි අසළ සිටි වෙළෙන්දෙකුද අසාධාරණ ලෙස ඉවත් කිරීම කර ඇති බව පැවසීමත් සමඟ ගරු සභාපතිතුමා පැවසුයේ පදික වෙළඳාම නගරයේ කොතැනකවත් සිදු කිරීමට අවසර ලබා දීමක් සිදු කළ නොහැකි බවත්,එසේ පිටස්තර නගර වලින් පැමිණ මෙහි වෙළඳාම් සිදු කරන බවත්, ඒ අනුව එයද පදික වෙළඳාමක් බැවින් ඉවත් කළ බවයි.

අනතුරුව ගරු සභාපතිතුමා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ යෝජනාව පිළිබඳ නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර ඉදිරියේදී පියවර ගැනීම සුදුසු බව පවසන ලදී.

**07:07:02** කොමර්ෂල් බැංකුව පිවිසුම් මාර්ගය අසළින් ආරම්භවන පදික වේදිකාවේ වම්පස කොටස ලංකා බැංකුව දක්වා අත්වැටක් සැකසීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා කොමර්ෂල් බැංකුව පිවිසුම් මාර්ගය අසළින් ආරම්භවන පදික වේදිකාවේ වම්පස කොටස ලංකා බැංකුව දක්වා පදික වෙළඳාම සිදු නොවුවද යම් අවහිරයක් පෙන්නුම් කරන බවත් අත් වැටක් යොදන්නේ නම් එම අවහිරතාවය නොමැතිව මඟීන්ට ගමන් කිරීමට හැකියාව ලැබෙන බවත් කරුණු පැහැදිලි කරමින් පැවසීය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය බළන්ගොඩ නගර සභාවට අයත් තානායම මේ වන විට පවරා ගැනීමට සූදානම් වන බැවින් ඒ සම්බන්ධව ලබාගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාදැයි විසමන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ සභාවේ එකඟත්වය නොමැතිව වුවත් ලංකාවේම පවත්නා තානායම් නාගරික සංවර්ධන අධිකාරියට අයත් ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනයට පවරා ගැනීමට රජය ප්‍රතිපත්තිමය තීරණයක් ලබා ගෙන ඇති බවත්, මේ සම්බන්ධව එම සමාගම සමඟ දුරකථනයෙන් සාකච්ඡා කළ බවත්, ඒ අනුව එම සමාගම දැනට තානායම වෙනුවෙන් සභාව දරා ඇති අළුත්වැඩියාවට අදාළ ණය මුදල ආදිය ආපසු සභාවට ලබා දෙන බව පැවසූ බවත්, විෂය භාර අමාත්‍යතුමා සමඟද මේ සම්බන්ධව සාකච්ඡාවක් ඉල්ලුම් කර ඇති බවත්,නිශ්චිතවම තානායම පවරා ගැනීම සිදු කරනු ඇති බවත් පවසන ලදී.

මෙය ප්‍රතිපත්තිමය තීරණයක් නොවන බවත්, කැබිනට් මණ්ඩල තීරණයක් පමණක් බවත්, කැබිනට් මණ්ඩල තීරණවලට විරුද්ධව සභාවට අධිකරණයට වුවද යා හැකි බවත්, තානායම භාර දීමේදී පැවතියේ ගොඩනැගිල්ලක් පමණක් බවත්, සභාව මේ තත්වයට රැගෙන ඒමට විශාල පිරිවැයක් දරා ඇති බවත්,ඉදිරියේදී වැටුප් ප්‍රතිපූර්ණයෙන් යම් ප්‍රමාණයක් කප්පාදු කරන බවත්,ඒ අනුව සභාවට ලැබෙන ආදායම් මාර්ග රැකගැනීම කළ යුතු බවත්, ගරු සභාපතිතුමාට මෙම ගැටළුව පිළිබඳ දිස්ත්‍රික්

සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කිරීමට හැකියාව තිබූ බවත්, ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මේ පිළිබඳ තම අදහස් දක්වමින් පැවසීය.

ගරු සභාපතිතුමා පැවසූයේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ න්‍යායපත්‍රයට පිටින් එසේ සාකච්ඡා කිරීම් කළ නොහැකි බවත්, විෂය භාර ආමාත්‍යවරයා සමඟ සාකච්ඡා කිරීමේදී ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා එයට සහභාගී වන ලෙසත්ය.

මෙහිදී සභාවේ මේ සම්බන්ධව දීර්ඝ සාකච්ඡාවක් ඇති වී අවසානයේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සමඟ සාකච්ඡා කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.

**විශේෂ යෝජනා**

**07:08** සභාව සඳහා වැලි කියුබ් 01ක් රු.16490.00 ක මුදලකට ලබාදීමට එකඟවුවද මෙම දිනවල වැලි හිඟතාවයක් පවතින බවත්, වැල්ලවාය ප්‍රදේශයේ සිට වැලි ප්‍රවාහනය කිරීමට සිදු වන බවත්, එබැවින් වැලි කියුබ් 01ක් රු.21,500.00 ක මුදලකට ලබා දීමට හැකි බවත්, ඒ අනුව එම මිල සංශෝධනය සිදුකර දෙන ලෙසත් දන්වමින් සැපයුම්කරු වන තිරණ කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් සප්ලයර් ආයතනය යොමුකර ඇති ලිපිය අනුව මිල සංශෝධනය සඳහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාගත කරන ලදුව ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී සභාවේ මේවන විට වැලි වල වෙළඳපොල මිල පිළිබඳව සාකච්ඡාවක් ඇතිවිය.ඒ අනුව ඇතිවූ සාකච්ඡාව අනුව වැලි සඳහා නැවත මිල ගණන් කැඳවීම සුදුසු බවට සභාව ඒකමතිකව තීරණය කරන ලදී.

**08. කාරක සභා වාර්තා සලකා බැලීම**

2025.08.05,2025.08.19 ,2025.09.02,2025.09.16 ,2025.09.19 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා ,2025.09.26 දිනැති කර්මාන්ත කාරක සභා වාර්තාව සහ 2025.09.23 දිනැති පරිසර හා ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කාරක සභා වාර්තාව යන කාරක සභා වාර්තා මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර එකී වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී 2025.09.23 දිනැති පරිසර හා ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කාරක සභා වාර්තාව තුළ අනුමත නොකරන ලද කාරණා අන්තර්ගත වන බවත් සංශෝධනයන් සිදුවිය යුතු බවටත් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවසන ලදී.ඒ අනුව ගරු සභාපතිතුමන් පැවසූයේ එම සංශෝධන සිදු කරන ලෙසයි.

**09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම**

**2025-07-01 සිට 2025-07-31 දක්වා ආදායම් වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 12,514,137.00 |
| මූලධන ලැබීම් | 123,767.00 |
| වෙනත් ලැබීම් | 2,975,742.00 |
| මුළු ලැබීම් | 15,613,647.00 |
| පුනරාවර්තන වියදම් | 14,022,070.00 |
| ප්‍රාග්ධන වියදම් | 1,684,100.0 |
| වෙනත් වියදම් | 2,169,665.00 |
| මුළු වියදම් | 17,875,835.00 |

**2025-08-01 සිට 2025-08-31 දක්වා ආදායම් වියදම්**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | 27,722,889.00 |
| මූලධන ලැබීම් | - |
| වෙනත් ලැබීම් | 2,205,675.74 |
| මුළු ලැබීම් | 29,928,565.10 |
| පුනරාවර්තන වියදම් | 15,075,104.00 |
| ප්‍රාග්ධන වියදම් | 2,540,435.00 |
| වෙනත් වියදම් | 2,096,817.00 |
| මුළු වියදම් | 19,712,358.00 |

**2025-08-01 සිට 2025-08-31 දක්වා ඉන්ධන වියදම**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---:|
| 56-1906 | 15103.14 |
| RD - 8240 | 84101.89 |
| Engine Oil | 1560.00 |
| 226-7521 | 14450.00 |
| BC-0005 | 69360.00 |
| Grees | 47700.00 |
| Hydrolik | 53150.00 |
| GC 0001 | 25925.00 |

| | |
|---|---:|
| 2T | 3800.00 |
| CSM 0009 | 610.00 |
| LL - 7688 | 15895.00 |
| DDR 0008 | 5202.00 |
| FP 0002 | 37000.00 |
| JD-4684 | 4270.00 |
| LL-2110 | 21984.23 |
| MM-8152 | 1525.00 |
| ND-5124 | 65605.89 |
| PF-4006 | 41185.39 |
| PH-4942 | 14450.00 |

| | |
|---|---:|
| RC-1107 | 18785.00 |
| VI 1833 | 3050.00 |
| RB 4786 | 35211.76 |
| Engine Oil | 1560.00 |
| RC 1118 | 39173.95 |
| Engine Oil | 1560.00 |
| ZA 5039 | 23859.84 |
| GK 1483 | 48554.89 |
| RD 8000 | 28902.89 |
| GK 6227 | 28235.30 |
| ZA 9835 | 90168.00 |
| Engine Oil | 6240.00 |
| **එකතුව** | **849,739.17** |

**2025-09-01 සිට 2025-09-30 දක්වා ඉන්ධන වියදම**

| **වාහන අංකය** | **මුළු එකතුව** |
|---|---|
| RC-1107 | 19246.83 |
| Engine Oil | 3120.00 |
| RD - 8240 | 57457.49 |
| 226-7521 | 30847.00 |
| BC-0005 | 67920.00 |
| GC 0001 | 11900.20 |
| 2T | 1900.00 |
| UQ-1933 | 2392.00 |
| LL - 7688 | 28300.00 |
| DDR 0008 | 6509.00 |
| JD-4684 | 2093.00 |
| LL-2110 | 31633.74 |
| Kerosine Oil | 1850.00 |
| MM-8152 | 1495.00 |
| ND-5124 | 62826.00 |
| PF-4006 | 35660.83 |
| ZA 0228 | 12171.83 |
| VI 1833 | 2990.00 |
| RB 4786 | 68293.56 |
| Engine Oil | 1560.00 |
| RC 1118 | 41320.83 |
| ZA 5039 | 78911.72 |
| GK 1483 | 65941.83 |
| Engine Oil | 1560.00 |
| RD 8000 | 53212.49 |
| GK 6227 | 14435.83 |
| Engine Oil | 1560.00 |
| HF 7899 | 52355.00 |
| Grees | 47000.00 |
| Hydrolik | 33600.00 |
| ZA 9835 | 131560.00 |
| Engine Oil | 6240.00 |
| **එකතුව** | **965,422.01** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පසුගිය සභා වාරයකදී කාර් පාක් අංක 06 කඩ කාමරය සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් සිදු කරන ලෙස දැන්වූ බවත්, 2018 වර්ෂයේදීද මෙම යෝජනාව ඒකමතිකව සම්මත වී ඇති බවත්, නගර සභාව මඟින් මුදල් ගෙවූ රිසිට් පතක paid by යනුවෙන් සඳහන් කර ඇති බවත්,ගෙවීමට පැමිණි අය මෙලෙස වංචනිකව මාස 03කදී නම ඇතුළත් කර ඇති බවත්,එය උපයෝගී කරගෙන එවකට සිටි ආණ්ඩුකාරතුමා නොමඟ යවන ලෙස සභාවෙන් ලිපි යවා ඇති බවත්,ඒ පිළිබඳව පරීක්ෂණයක් ඉල්ලූ බවත්, ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරුන් එක් පැත්තකට ගැනීමටවත් සභාපතිතුමා සභාපතිධූරයෙන් නෙරපීමටවත් නොවන

බවත්,සභාපතිතුමා හාල්පාරුවෝ යැයි ආමන්ත්‍රණය කරමින් දෝෂාරෝපණයක් සිදු කර තිබූ බවත්, නමුත් ප්‍රශ්නයක් නොමැති බවත්, ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය වංචාව දූෂණය නැති කිරීමට සැහෙන්න උත්සහයක් දරන බවත්, ඒ අනුව පසුගිය කාලසීමාවන්වලදී හක්මාවශේෂ වූ පක්ෂ වලින් යැයි කියන තමන් පැමිණ වංචාවක් සිදු වූ බව පෙන්වා දුන් බවත් නිසි විමර්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලීම් කරන බවත් පැවසීය.
එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් සභාවේ සිදුවූ සිදුවීම වෙනත් ආකාරයකින් සේවකයන් වෙත පවසා විදුලියද විසන්ධි කර විශාල ප්‍රශ්නයක් සිදුවූ බවත්, නමුත් එම අවස්ථාව පිළිබඳ අපක්ෂපාතීව කටයුතු කර මාධ්‍යය වෙත සත්‍ය වාර්තා කළ මාධ්‍යවේදීන් වෙත ස්තූතිය පුද කරන බවත්, වැරදි නොකරන කිසිඳු අයෙකු බිය විය යුතු නොවන බවත් පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු සභාපතිතුමන් මෙහිදී පැවසුයේ එම පරීක්ෂණය සිදු කිරීමට පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ලිපියක් නිකුත් කර ඇති බවත් ඒ පිළිබඳ දිගින් දිගමට කතා කිරීම අවශ්‍ය නොවන බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා තම අදහස් දක්වමින් පසුගිය සභාවේ ඇතිවූයේ එම පරීක්ෂණය සිදු නොකරන්නේ ඇයිද යන්න පිළිබඳව ගැටළුවක් බවත්, සභාපතිතුමා ඒ පිළිබඳ ලිපි ඉදිරිපත් කළ යුතු බව කාගේත් මතය වු බවත්, සභාපතිතුමාට එම ගැටළුව විසඳිය හැකිව පැවති බවත් දන්වමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා තම අදහස් දක්වමින් ගරු සභාපතිතුමා බළන්ගොඩ නගරයේ පළවෙනි පුරවැසියා සභාවේ මන්ත්‍රීතුමන්ලා 16 දෙනාගේ සභාපතිතුමා බවත්, නමුත් මෙම ගැටළුව ඇතිවූ අවස්ථාවේ වැඩ බැලූ ගරු උප සභාපතිතුමා ඉතාම පැහැදිලිව මාධ්‍යය වෙත තොරතුරු වාර්තා කළ බවත්,නමුත් සභාපතිතුමා පසුදින මාධ්‍යය වෙත පැමිණ ඉතාම වැරදි ලෙස පක්ෂ, මාධ්‍යය යනාදී දේවල්ද අදාළ කරගනිමින් කතා කළ බවත්, එසේ සිදුවීමක් නැවත සිදුවුවහොත් සජබයේ අවසානය බව පැවසූ බවත්, සජබය,හිරු නිව්ස්,නයි දෙරණ ආදිය එකතු වී සභාව පවත්වා ගෙන යාමට ගැටළු ඇති කරන බව ප්‍රකාශ කළ බවත්ය.

තවදුරටත් එතුමා අදහස් දක්වමින් සභාවේදී තමාට පක්ෂ අදාළ නොවන බවත්, හොඳ දේටත් හරි දේටත් සැම විටම සහයෝගය ලබා දුන් බවත්, නමුත් සභාපතිතුමා මාධ්‍යය වෙත අදහස් දැක්වීමේදී තම පක්ෂයට සහ පක්ෂයේ මන්ත්‍රීවරුන්ට ශාප කළ බවත්,සභාපතිතුමාටද ෆේස් බුක් එක ඔස්සේ අමුතු ලෙස අදහස් දැක්වීම් සිදු කර තිබූ බවත්, නමුත් සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී කණ්ඩායම ගෙනෙන ඕනෑම

ඵලදායි යෝජනාවකට එතුමාගේ සහයෝගය ලබා දෙන බවත්, එම වැරදි සහගත ප්‍රකාශය සභාපතිතුමා ඉල්ලා අස්කර ගත යුතු බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය තම අදහස් දක්වමින් අනතුරුදායක බැම්මක් සම්බන්ධව ගැටළුවක් සම්බන්ධව සභාපතිතුමා දැනුවත් කළ බවත් හැකි ඉක්මනින් ඒ සම්බන්ධව කටයුතු කරන ලෙසත්, වරිපනම් සම්බන්ධව තමාට විශාල ගැටළුවක් සිදු වූ බවත්, වරිපනම් අයනොවෙන කරවිකැටිය ප්‍රදේශයේ ස්ථාන පවතින බවත්, පසුගිය සභාවේ සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් තම පක්ෂය පිළිබඳව සභාපතිතුමාගේ අදහස් දැක්වීම පිළිබඳ ඉතාම කණගාටු වන බවත්, පොලිසියෙදීත් සභාපතිතුමා සභාවේ මන්ත්‍රීතුමියකට කතා කළ ආකාරය වැරදි බවත් පවසමින් එතුමියගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා තම අදහස් දක්වමින් ප්‍රථමයෙන්ම වැලිගම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමාගේ ඝාතනය සම්බන්ධව ශෝකය පළ කිරීමට අවස්ථාවක් කරගන්නා බවත්, පසුගිය සභා වාරයේදී සිදු වූ සිදුවීම ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා නිලධාරීන් පිළිබඳ ද්වේශසහගත අදහස් ප්‍රකාශකිරීමක් හේතුවෙන් සිදු වූ බවත්,එහිදී නිලධාරීන් අපහසුතාවයට පත් වූ බවත්, නමුත් සභාව තුළ කටයුතු කිරීමේදී පක්ෂ පාට බේද අදාළ නොවන බවත්,එකම කණ්ඩායමක් සේ ක්‍රියාකළයුතු බවත්, සියළුම දෙනාගේ සහයෝගය සභාව කරගෙන යාමට අවශ්‍ය බවත්, එදින දිගින් දිගටම මතු වූ ගැටළුවක් ලෙස සභාවේ නිලධාරීන් සභාවට සූදානම් නොවීම සිදු වූ බවත්,අදදින එය යම් ප්‍රමාණයකින් සාර්ථක වී ඇති බවත් නමුත් තව දුරටත් ඉදිරි සභා වලදී එය වර්ධනය කරගනී යන්න බලාපොරොත්තු වන බවත්, එමෙන්ම 20%ක් වැටුප් ප්‍රතිපූර්ණය සඳහා වෙන් කිරීමට යන කාරණාව සැලකීමේදී, අයවැය කළමණාකරණයේදී සංවර්ධන සුහසාධන වැඩ නතර කිරීම සිදු කළ නොහැකි බවත්,කළයුත්තේ අනවශ්‍ය වියදම් කප්පාදු කිරීම බවත්, සභාවේ වාහන වෙනුවෙන් විශාල නඩත්තු වියදමක් දැරීමත් විශාල ගැටළුවක් බවත්, එසේ සිදු වීමට හේතු වී ඇත්තේ සභාව සතු වාහන පැරණි වීම නිසා බැවින් ඒවා පිළිබඳ සලකා බැලිය යුතු බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා**

ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා අදහස් දක්වමින් පසුගිය සභාවේ සිදු වූ විශේෂ සිදුවීම සභාවක් තුළ නොවිය යුතු සිදුවීමක් බවත්,කුමක් හෝ හේතුවක් මත සභාවේ නිලධාරීන් හා මන්ත්‍රී මණ්ඩලය අතර දෙපාර්ශවටම චෝදනා එල්ල වූ බවත්, එය නොවිය යුතු බවත්,සේවක මණ්ඩලය දැඩි කැපවීමකින් වැඩ කරන බවත් සමහර සේවකයන් අදාළ තනතුරේ නොවුවද කැපවීමකින් පවරා ඇති රාජකාරිය ඉටුකරන බවත්, එම සේවකයන් අගය කරන බවත්, කෙසේ සිදු කළද විවේචන එල්ල වන බවත්, වැඩ නොකරන සමහර සේවකයන් පිරිසක්ද සිටින බවත්, නැවතත් ඇති වූ සිද්ධිය සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අයවැය සම්බන්ධව විශේෂයෙන් සලකා බැලිය යුතු බවත්, වැටුප් ප්‍රතිපූර්ණය කප්පාදු කිරිම විශාල ගැටළුවක් විය හැකි බවත්, සංවර්ධන යෝජනා සහ සුභසාධන යෝජනා කපාහැරීම නොකළයුතු බවත්,සභාපතිතුමා මැදිහත් වී සභා අරමුදල වෙත ප්‍රධානයක් රජයෙන් ඉල්ලුම් කරන ලෙසත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.ගරු සභාපතිතුමා පැවසුයේ අයවැය සම්බන්ධ පුළුල් සාකච්ඡාවක් සිදු කිරීමට නියමිත බැවින් එදින සාකච්චඡා කිරීම සුදුසු බවයි.

**ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් තමාගේ පියාටත් වඩා වැඩිමල් අයෙකු වන සභාපතිතුමාට මෙසේ කතා කිරීමට සිදුවීම පිළිබඳව කණගාටු වන බවත්, එදින සිදුවීම වූයේ කඩ කාමරයක් සම්බන්ධව බවත්, එදින වැඩ බලන සභාපතිතුමාට පරීක්ෂණයක් සිදු කිරීම සම්බන්ධව ප්‍රකාශයක් කිරීමට හැකියාව තිබු බවත්, නමුත් කාරක සභා අවස්ථාවක් කර ලේකම්තුමියගෙන් කරුණු විමසීමක් කර අවශ්‍යනම් පරීක්ෂණයක් පෞද්ගලිකව කරගැනීමට හැකි බව පැවසූ බවත්, හොරාගේ අම්මාගෙන් පේන අහනවා වගේ වැඩක් කළ බවත්, එය පදනම් කරගෙන ගැටළුව ඇතිවූ බවත්, නිවරදි පිළිතුරක් ලබා දුන්නේ නම් එය සිදු නොවන බවත්,වැඩ බලන ලේකම්තුමිය සභාවෙන් පිටවුනු බවත්, පසුව සභාවේ සේවකයන් සංවිධානය වන ආකාරය තමන් දුටු බවත්, පසුව තමන් ඇතුළු කණ්ඩායම සභාවෙන් පිටවෙද්දී පහරදීමට සූදානම් වූ බවත්, සභාවේ නිලධාරින් සියල්ලෝම හොරු කියන්නෙත් නැති බවත් පිරිසක් සිටින බවත්, ගරු ජනාධිපතිතුමා පැමිණ ඇත්තේ වංචාව නැතිකරන්න බවත්, තමාගේ කාලයේදීත් වැරදිදේට විරුද්ධ වූ බවත් වමික සභාපතිතුමාගේ කාලයේ එසේ විරුද්ධ වීමට හැකියාව තිබූ බවත්, සභාපතිතුමා පත්වූ මුල්කාලයේ

පළපුරුද්දක් නැතිබව ප්‍රකාශ කළ බැවින් අවශ්‍ය සහයෝගය ලබා දුන් බවත්, නමුත් පසුව සමහර තැන්වලදී වෙනත් අය සභාපතිතුමාව නටවනවා සේ දැනුන බවත්, එසේ වීම බලන් ඉන්නත් බැරි බවත් පැවසීය.

තවදුරටත් එතුමිය අදහස් දක්වමින්, සිදු වූ සිද්ධිය පිළිබඳ වාර්තා කිරීමට පොලිසියට යැමට සිදුවූ බවත්,එහිදි සභාපතිතුමා සිද්ධිය දුටුවා සේ කතා කළ බවත්, තමන්ව නිශ්ශබ්ද කිරීමට අල්ලස් හා දූෂණයේ පැමිණිල්ලක් තිබෙන බව පැවසූ බවත්, තමාට දෙමව්පියන් හොඳට උගන්වා ඇති බවත්, පාසල් ගියේ විශාකා විද්‍යාලය හා බණ්ඩාරගම ජාතික පාසලට බවත්, තමාට ඇති තරම් දෙමව්පියන්ගේ දේපළ පවතින බවත්, එලෙස පැමිණිල්ලක් පවතීනම් එය අල්ලස් හා දූෂණ කොමිසම වෙත දැනුම් දෙන ලෙසත්,එලෙස අල්ලස් ගැනීමට තරම් තමන්ට ආර්ථික ගැටළුවක් නොමැති බවත්, මෙහි දීමනාවද තමන් පොදු කටයුතු වෙනුවෙන් යොදවන බවත්, එලෙස චෝදනා කිරීම සිදු නොකරන ලෙසත්, වැඩබලන ලේකම් යැයි පැවසීමේදී ලේකම්තුමියව රැකීම කළ බවත්,නමුත් එතුමිය මෙහෙම සභාපති කෙනෙක් සමඟ වැඩ කර නැති බව පවසා ඇති බවත්, පවසමින් එතුමියගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම සභාවේ කතා කරන්න අකමැති බවත්, මීන් පෙර සභා වාර හයක් තමන් නියෝජනය කළ බවත්, එම සෑම සභා වාරයකදීම තමාගේ ජවනිකාව සිදු කළ බවත්,මෙම සභාවේ තමාගේ ජවනිකාව කිරීමට අවශ්‍ය නොවන බව අදහස් කරන බවත්, එම සභා වාරවලදී සභාපතිවරුන් සමඟ කුමකට රණ්ඩු වුවද ඒ ජනතාව වෙනුවෙන් බවත්,නමුත් නිලධාරීන් සමඟ ඉතාම සුහදව කටයුතු කළ බවත්,නමුත් මෙම සභාවේ මන්ත්‍රීවරුන් අතරවත් සුහදතාවයක් නොමැති බවත්, අවම ලෙස සමහර දුරකථන අංකයක් වත් නොමැති බවත්, නිලධාරින් මණ්ඩලය හා මන්ත්‍රී මණ්ඩලය අතරද සුහදතාවයක් නොමැති බවත්, තමාගේ ධූරකාලයේදී නිලධාරීන්ට අදාළ වන පරිපාලන කටයුතු ලේකම් සිදුකළ යුතු බැවින් එය මනාව සිදු කළ බවත්,තමා ඊට මැදිහත් නොවූ බවත්,දේශපාලන අධිකාරිය පැමිණෙන්නේ ජනතා සේවයට බැවින් එය නිවරදිව ඉටු කළ බවත්,පළාත් පාලන රාමුවෙන් ඔබ්බට ගොස් වැඩ කටයුතු සිදු කළ බවත්, මෙවැනි සභාවක් මීන් පෙර පැවතියේ නැති බවත්,සභාපතිතුමාට දෝෂාරෝපණය නොකරන බවත්, ඊටත් වඩා වයසින් වැඩි පුද්ගලයින් රාජ්‍ය නායකයන් ලෙසද කටයුතු කරන බවත්, පසුගිය සභා වාරයේ ඇති වූ සිද්ධිය පිළිබඳ කණගාටු වන බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා අතින් අදාළ නොවන වචනයක් පිටවූ බවත්, සභාපතිතුමාද එදින නොසිටීම තවත් හේතුවක් වී උප සභාපතිතුමාට ඇතිවූ තත්වය පාලනය කර ගැනීමට නොහැකි වූ බවත් පැවසීය.

මෙහිදී වැඩිදුරටත් එතුමා අදහස් දක්වමින් තමන් අවුරුදු විසිගණනක් සභාව නියෝජනය කළද ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි

මැතිතුමා වැනි මන්ත්‍රීතුමාලාගෙන් ඉගෙන ගත යුතු දේවල් පවතින බවත්, එම මන්ත්‍රීතුමන්ලාද තමන්ගෙන් ඇතැම් දේවල් ඉගෙන ගෙන ඇති බවත්, ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා කතා කරන දේවල් වල කිසිම අඩුවක් වැරැද්දක් නොදකින බවත්, හරියට නීතියට තර්කානුකූලව කතා කරන බවත්, ඒවා නොකෙරුනු අවස්ථාවලදී ආවේගශීලීව කතා කරන බවත්, එය පෙර සභාවන්වලද පැවති බවත්, එදින ඇති වූ තත්වය උප සභාපතිතුමාට අත්දැකීමක් නොමැති බැවින් පාලනය කර ගැනීමට නොහැකි වූ බවත් එදින සභාවේ එම සිද්ධිය නොවූවද මෙම සභාවේ විදුලි කාර්මික ගැටළුව පිළිබඳ කතා කිරීමට සේවකයන් පෙළගැසී සිටි බව තමන් දන්නා බවත්,කව්රු මොනවා කිව්වද සභාව වැටෙන්න ඉඩ දීමට නොහැකි බවත්, සභාව ඉදිරියට රැගෙන යාමට මෙය යම් පූර්වාදර්ශයක් කරගත යුතු බවත්, සභාපතිතුමාද මාධ්‍යය වෙත අදහස් දැක්වීමේදී වැරදි ලෙස අදහස් දක්වා ඇති බවත් එතුමාටද එම අවස්ථාවේ පාලනයක් නොමැතිව වැරදි දේ කියවෙන්න ඇති බවත්, සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙකු ලෙස ජනතාවට අවශ්‍ය සේවය ලබාදීමේදී පමණක් අවශ්‍ය වේලාවට රණ්ඩු කරගමු යැයිද සභාවේ කාලය අනවශ්‍ය දෑ වෙනුවෙන් වැය නොකර සිටිමු යන්න ඉල්ලීම් කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11.** **අවසානය**

මින් ඉදිරියට පසුගිය සභාවේ මෙන් ගැටළු ඇති කර නොගෙන සාමූහිකව වැඩ කටයුතු සිදු කළ යුතු බවටත් සියළු දෙනාගේ සහයෝගය අවශ්‍ය බවත් සභාවට සිහිගැන්වීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා සහ විශේෂයෙන් සභාව සාර්ථකව පවත්වා ගෙන යාමට නිරන්තර උපදෙස් ලබා දෙන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රී තුමන්ලා වෙතද ස්තූතිය පුදකරමින් ප.ව.1.10ට පමණ මෙදින මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**කේ. ජී.පේමදාස,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.